වාර්ෂික වාර්තාව

2020

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2021-07-14

ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන
වෙළඳ අමාත්‍යාංශය,
අංක 492,
එල්. එච්. පියසේන ගොඩනැගිල්ල,
කොළඹ 03.

ගරු ඇමතිතුමනි,

<u>වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - 2020</u>

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2020 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- **සභාපතිතුමාගේ වාර්තාව**
- **ගිණුම් ප්‍රකාශන**
- **විගණකාධිපතිගේ වාර්තාව**

මෙයට- විශ්වාසී

සුරේෂ් ද මැල්
සභාපති සහ ප්‍රධාන විධායක
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

පටුන

		පිටුව
1.	හැඳින්වීම	4-5
2.	සභාපතිතුමා ගේ පණිවුඩය	6
3.	ආයතනික තොරතුරු - අධ්‍යක්ෂ මණ්ඩලය	7-8
	ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්ය මණ්ඩලය	9
4.	අපනයන කාර්යසාධනය 2020	10
	ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනය 2020	11-15
	2020 ජන. - දෙසැ. දක්වා වන කාලසීමාව තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය.	16-23
	සැපයුම් හා නිෂ්පාදන සංවර්ධනය	24
	ධාරිතා වර්ධන වැඩසටහන්	25
	අපනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම	26-28
	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SME) සංවර්ධනය	29-34
	අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම	35-36
	2021 වසර සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ අනාගත සැලසුම්.	37-39
5.	මූල්‍ය ප්‍රකාශන 2020	40
	2020.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය	41
	2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	42
	2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	43
	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	44
	මූල්‍ය ප්‍රකාශන සටහන්	45-54
6.	විගණකාධිපති වාර්තාව	55-61

හැඳින්වීම

අපනයන ඉපැයීම් වැඩිකරමින් රටේ ආර්ථික වර්ධනය උදෙසා දායකත්වය ලබාදීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) පුමුඛතම කාර්යය වේ.

රටෙහි ප්‍රමුඛතම වෙළඳ ප්‍රවර්ධන සංවිධානය (TPO) ලෙස නෛතික වශයෙන් පිළිගත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ජාත්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ සෑම කරුණක්ම ආවරණය කරන ආයතනයක් ලෙස සිය කාර්යභාරය ඉටුකරයි.

අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ 1979 දී ස්ථාපනය කරන ලද අපනයන සංවර්ධන මණ්ඩලය ජාතික අපනයන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා උපායමාර්ග ක්‍රියාත්මක කිරීමෙහිලා එහි වගකීම් ඉටු කරමින් ප්‍රතිපත්ති උපදේශකයෙකු, අධීක්ෂකයෙකු, ප්‍රවර්ධකයෙකු, පහසුකම් සලසන්නෙකු හා දැනුම ලබාදෙන්නෙකු ලෙස එහි කාර්යභාරය ඉටු කරනු ලැබේ.

ඒ අනුව, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පහත දැක්වෙන උපායමාර්ගික කාර්යයන්ට අනුගතව කටයුතු කරනු ලැබේ. මෙම කාර්යයන් අපනයනකරුවන් සංවර්ධනය කිරීම සහ අපනයන ප්‍රවර්ධනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, මානව ප්‍රාග්ධන සංවර්ධනය හා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම දක්වා වන අපනයන සංවර්ධන මණ්ඩලයේ විවිධ අංශ හරහා ක්‍රියාත්මකවේ.

දැක්ම

"නව නිපැයුම් සහ සේවා සඳහා ශ්‍රී ලංකාව ප්‍රධාන අපනයන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම"

මෙහෙවර

"නවෝත්පාදන, ව්‍යවසායකත්ව හා ගෝලීය ඒකාග්‍රතාව තුළින් අපනයන තරගකාරිත්වය තහවුරු කිරීම"

උපායමාර්ගික අරමුණු

1. **දැනට සිටින අපනයනකරුවන් සඳහා ඔවුන්ගේ අපනයනයන් ආරක්ෂාකර ගැනීමට සහය වීම -** ජාත්‍යන්තර වෙළඳාමේදී තරගකාරිවීම සඳහා අපනයනකරුවන්ට සුදුසු ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා.
2. **ශ්‍රී ලංකාවේ වත්මන් අපනයනයන් වෙනස් කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් නව අපනයනයන් ප්‍රවර්ධනය කිරීම -** අගය එකතු කිරීම, නවෝත්පාදන හා නව නිපැයුම් හඳුන්වාදීම වත්මන් අපනයනයන් විවිධාංගිකරණය කිරීම සඳහා.

3. **නව වෙළඳපල විවිධාංගිකරණය** - අපනයන වෙළඳපල කීපයක් හා නිෂ්පාදන ගමනාන්ත කීපයක් මත යැපෙන වත්මන් අපනයන වෙළඳපල විවිධාංගිකරණය කිරීම සඳහා.
4. **ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීම** - තම කර්මාන්ත සංවර්ධනය කිරීමේදී අපනයනකරුවන්ගේ ධාරිතාවන් වැඩි කිරීම සඳහා.
5. **අපනයන ප්‍රමුඛ විදේශ ආයෝජන උත්පාදනය කිරීම** - නිෂ්පාදනය, ඵලදායිතාවය වැඩිකිරීම හා උසස් තාක්ෂණය සඳහා අනුගතවීම සඳහා

අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යයන්

- සාර්ව/ ක්ෂුද්‍ර ආර්ථික පරිසරය වැඩිදියුණු කිරීම සඳහා සහයවීම.
- ජාතික අපනයන සංවර්ධන සැලැස්ම, ආංශික සැලැස්ම ආදිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ඒකාබද්ධ සැපයුම්/ තාක්ෂණ/ තත්ව/ ඇසුරුම්කරණ/ සැළසුම් සකස් කිරීමේ වැඩසටහන්.
- වෙළඳපල අවස්ථා හඳුනාගැනීම සඳහා වෙළඳපල පර්යේෂණ/ සමීක්ෂණ.
- පවතින වෙළඳපල පුළුල් කිරීම හා නව/නැගීඑන වෙළඳපලට පිවිසීම සඳහා වෙළඳපල සංවර්ධනය හා ප්‍රවර්ධනය.
- ප්‍රාදේශිය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්.
- වෙළඳපල තොරතුරු හා විද්‍යුත් වාණිජ්‍ය සේවාවන් සැපයීම.
- වෙළඳපල කාර්යක්ෂමතාවය ඇතිකරගැනීම සඳහා අපනයනකරුවන් මුහුණදෙන ගැටළු/ අවහිරතාවලට විසඳුම් ලබාදීම.
- අපනයන සහය සේවාවන් හි තත්වය වැඩිදියුණු කිරීම.
- ජාත්‍යන්තර/දේශීය වෙළඳ සහය සේවාවන් සමග කටයුතු කිරීම.
- නිපුණතා/ ව්‍යවසායකත්ව/ පුහුණු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- 2014 ජූලි 11 දිනැති අංක 1870/71 දරණ පනතේ දක්වා ඇති පරිදි ජාතික කාබනික නියෝග ක්‍රියාත්මක කිරීම.

සභාපතිතුමාගේ පණිවුඩය

COVID-19 වසංගතය හමුවේ ගෝලීය ආර්ථිකය හා ලෝක වෙළඳාම පෙර නොවූ විරූ කඩාවැටීමකට ලක් වූ අතර එහි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජයට සිදුවුනි.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන හා සේවා අපනයන සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රමුඛපෙළ ආයතනය වශයෙන්, මෙම කාලය තුළදී මණ්ඩලයේ අඛණ්ඩ කැපවීම මෙන්ම අනිකුත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශය සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම මඟින් පැසසිය යුතු අපනයන කාර්ය සාධනයක් වාර්තා කිරීමට හැකි විය.

වෛරසය පැතිරීම සහ ඒ සඳහා පැවති පාලන ක්‍රමවේද තීව්‍ර වූ කාල වකවානුවේ භාණ්ඩ අපනයන තියුණු ලෙස පහත වැටුණු නමුත්, අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉක්මනින් වසංගතයට පෙර තිබූ මට්ටමට ළඟාවිය. එමෙන්ම, COVID-19 පැතිරීම මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර තිබූ හුදකලා කිරීම් සහ අනෙකුත් මහජන සෞඛ්‍ය සීමා කිරීම් 2020 දී අපනයනය කළ හැකි භාණ්ඩ නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑවේය. මේ අතර, බාහිර ඉල්ලුම අඩුවීම, නැව්ගත කිරීමේ හා සැපයුම් දාමයන්ට ඇතිවූ බාධා, විදේශ රටවල් අගුල්දැමීමේ පියවර හේතුවෙන් අවශ්‍ය යෙදවුම් ආනයනය කිරීමේ ගැටළු සහ අහිතකර මිල උච්චාවචනයන් ද 2020 වර්ෂය තුළ සමස්ත අපනයන ක්‍රියාකාරිත්වයට බලපා ඇත.

COVID-19 මඟින් බලපෑමට ලක් වූ අපනයන අංශ පුනර්ජීවනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අපනයන සංවර්ධන මණ්ඩලය 2018-2022 ජාතික අපනයන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කළේය. මේ අතර, වසංගත කාල පරිච්ඡේදය තුළ මාර්ගගත ක්‍රම මඟින් මණ්ඩලය අඛණ්ඩව වෙළඳපල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළේය. අගය එකතු කළ කර්මාන්ත වැඩි කිරීම තුළින් අපනයන ආර්ථිකය පුළුල් කරමින් ශ්‍රී ලංකාව සමෘද්ධිමත් රටක් බවට පත් කිරීම ද රජයේ අවධානයට ලක්ව තිබේ.

අපනයන සංවර්ධන මණ්ඩලයෙහි සභාපතිවරයා වශයෙන් මම අනාගතයේ දී ධනාත්මක වෙනස්කම් ගෙන ඒමට කැපවී සිටිමි. අපගේ වඩාත් අභියෝගාත්මක අවස්ථාවේදී ජාතික ආර්ථික අවශ්‍යතා සපුරාලීම පිළිබඳව සමස්ත අපනයන ප්‍රජාවට ස්තූතිවන්ත වන අතර අපගේ අපනයන ප්‍රජාවට සේවය කිරීමට මණ්ඩලයෙහි අපි සූදානම්ව සිටිමු. අපනයනකරුවන් අනාගතයේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා ධනාත්මක ස්ථාවරයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අපනයන අංශය මේ වන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වැදගත්ම අංශය බවට පත්ව ඇති අතර, අප ඉදිරියටත් සාර්ථක ප්‍රතිඵල ලබා ගනිමින් ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රයේ උසස් මට්ටමකට ළඟා වීමට අපේක්ෂා කරමු.

අවසාන වශයෙන්, අමිල සහයෝගයක් ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට මාගේ ඉහළම කෘතවේදීතාව පළ කිරීමට කැමැත්තෙමි. එමෙන්ම, සංවිධානයේ ඉලක්කය සපුරා ගැනීම සඳහා වසර පුරා මණ්ඩලයෙහි කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය දරන උත්සාහය සහ කැපවීම අගය කලයුතු වේ. මෙම සහයෝගීතාවය සහ සේවයේ විශිෂ්ටත්වය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අවසන් වශයෙන්, මාගේ ස්තූතිය ඔබට පිරිනමමි.

සුරේෂ් ද මැල්
සභාපති සහ ප්‍රධාන විධායක

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2020

			සිට	දක්වා
1.	ප්‍රභාෂ් සුභසිංහ මහතා	සභාපති	2019.12.18	2020.12.02
2.	සුරේෂ් ද මැල් මහතා	සභාපති හා ප්‍රධාන විධායක	2020.12.11	2020.12.31
3.	ආචාර්ය. ජානක වික්‍රමසිංහ මහතා	අධ්‍යක්ෂ	2019.12.16	2020.12.31
4.	චතුර වී. කබ්‍රාල් මහතා	අධ්‍යක්ෂ	2019.12.16	2020.12.31
5.	කෞෂල යහම්පත් මහතා	අධ්‍යක්ෂ	2019.12.16	2020.12.31
6.	ලලන්ත වතුදුර මහතා	අධ්‍යක්ෂ	2019.12.16	2020.12.31
7.	රන්ජිත් ප්‍රියන්ත වීරසිංහ මහතා	අධ්‍යක්ෂ	2019.12.31	2020.12.31
8.	ආචාර්ය. කේ. ලක්ෂ්මන් ජයරත්න මහතා	අධ්‍යක්ෂ	2019.12.31	2020.12.31
9.	පී. මොහොදීන් අම්සා මහතා **අතිරේක ලේකම්** **විදේශ අමාත්‍යාංශය**	අධ්‍යක්ෂ	2019.12.30	2020.12.31
10.	ඩබ්.ආ.ඩී.එස්. ගුණසිංහ මහතා **අතිරේක ලේකම්** **කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය**	අධ්‍යක්ෂ	2019.12.29	2020.09.01
11.	ඩී. ජීවනාදන් මහතා **අතිරේක ලේකම් (සංවර්ධන)** **වෙළඳ අමාත්‍යාංශය**	අධ්‍යක්ෂ	2020.09.02	2020.09.04
12.	කාන්ති ගුණවර්ධන මිය **අතිරේක ලේකම් (සංවර්ධන)** **වෙළඳ අමාත්‍යාංශය**	අධ්‍යක්ෂ	2020.09.05	2020.12.31
13.	එම්.එම්.පී.කේ. මායාදුන්න මහතා **ලේකම්** **වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය**	අධ්‍යක්ෂ	2019.12.26	2020.09.06
14.	යූ.ඩී.සී. ජයලාල් **ලේකම්** **වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය.**	අධ්‍යක්ෂ	2020.09.07	2020.12.31

			සිට	දක්වා
15.	ඒ.එච්.එස්. ෆරීදා මිය **අධ්‍යක්ෂ ජනරාල්** **ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය.**	අධ්‍යක්ෂ	2020.01.09	2020.12.31
16.	ජේ.ආර්. ජයතිලක මහතා **අධ්‍යක්ෂ/ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති** **අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන** **ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව.**	අධ්‍යක්ෂ	2020.01.18	2020.07.23
17.	අයන්ති දීපිකා ද සිල්වා මිය **අධ්‍යක්ෂ ජනරාල් - මුදල්, ආර්ථික හා** **ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ, ව්‍යාපෘති** **කළමනාකරණ හා අධීක්ෂණ** **දෙපාර්තමේන්තුව.**	අධ්‍යක්ෂ	2020.07.24	2020.12.31
18.	නිලක්ෂි ගුණසේකර මිය **අතිරේක ලේකම් (අධීක්ෂණ සහ** **ඇගයීම්)** **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.**	අධ්‍යක්ෂ	2020. පෙබරවාරි	2020.12.31
19.	ඩබ්.එම්.ටී.ඩී. වික්‍රමසිංහ මිය **අතිරේක ලේකම් (සංවර්ධන)** **වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම** **අමාත්‍යාංශය.**	අධ්‍යක්ෂ	2020.02.05	2020.12.31
20.	එන්.ජී. පණ්ඩිතරත්න **අතිරේක ලේකම් (පරිපාලන)** **කර්මාන්ත හා සැපයුම් දාම** **කළමනාකරණ අමාත්‍යාංශය.**	අධ්‍යක්ෂ	2020.05.20	2020.12.31
21.	සංජය මොහොට්ටාල මහතා **සභාපති** **ආයෝජන මණ්ඩලය**	අධ්‍යක්ෂ	2020.08.07	2020.12.31

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්ය මණ්ඩලය

සභාපති	-	ප්‍රභාෂ් සුභසිංහ මහතා (2020.12.02 දක්වා)
සභාපති සහ ප්‍රධාන විධායක	-	සුරේෂ් ද මැල් මහතා (2020.12.11 සිට)
අධ්‍යක්ෂ ජනරාල්	-	ජේ. සිරිවර්ධන මිය (2020.08.03 දක්වා) සී. දිසානායක මෙනවිය (2020.08.04 සිට)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන අංශය	-	සී. දිසානායක මෙනවිය (2020.08.03 දක්වා)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මුදල් හා පාලන අංශය	-	එම්. කේ.එස්.කේ. මල්දෙනි මහතා (2020.06.30 දක්වා)
කාර්මික නිෂ්පාදන අංශය - අධ්‍යක්ෂිකා	-	සී. දිසානායක මෙනවිය (2020.08.03 දක්වා)
- වැඩ බලන අධ්‍යක්ෂක	-	එච්.ඩී. පත්බෙරිය මහතා (2020.09.11 දක්වා)
අපනයන සේවා අංශය - අධ්‍යක්ෂක	-	එස්.කේ.මල්දෙනි මහතා (30.06.2020 දක්වා)
- වැඩ බලන අධ්‍යක්ෂිකා	-	මනෝජා දිසානායක මිය (15.07.2020 සිට)
අලෙවි සංවර්ධන අංශය - අධ්‍යක්ෂිකා	-	කේ. ඒ. වී. ප්‍රේමතිලක මිය
ප්‍රාදේශීය සංවර්ධන අංශය - අධ්‍යක්ෂිකා	-	සේපාලිකා ජයවර්ධන මිය (2020.06.25 සිට)
- වැඩ බලන	-	එස්.ආර්.පි. ඉන්ද්‍රකීර්ති මහතා(2020.01.31 දක්වා)
අධ්‍යක්ෂකවරු	-	ඩී.එම්.පී.දිසානායක මහතා (2020.06.24 දක්වා)
කෘෂි අපනයන අංශය - අධ්‍යක්ෂිකා	-	පි.වි.ඒ.එම්. බද්දේගමගේ මිය
මුදල් අංශය - අධ්‍යක්ෂිකා	-	ජී.එම්. හේරත් මෙනවිය
මානව සම්පත් කළමණාකරණ අංශය-අධ්‍යක්ෂක	-	කේ. කේ. ආර්. කන්නංගර මහතා
ප්‍රතිපත්ති හා උපායමාර්ගික-අධ්‍යක්ෂිකා	-	ඕ.එම්.සී.කුමුදුනී මිය (25.06.2020 සිට)
සැලසුම් අංශය -වැඩබලන අධ්‍යක්ෂිකා	-	අවිනි වීරවර්ධන මිය (24.06.2020 දක්වා)
වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු අංශය - අධ්‍යක්ෂක	-	එස්. ආර්. පි. ඉන්ද්‍රකීර්ති මහතා
තොරතුරු තාක්ෂණ අංශය - වැඩබලන අධ්‍යක්ෂක	-	ඩී.කේ.ඩී.එස්. සිසිල් (20.03.2020 සිට)
අභ්‍යන්තර විගණන අංශය	-	නිල්මිණි රණසිංහ මිය අභ්‍යන්තර විගණක
නීති අංශය	-	ඩී.ටී. විජයරත්න මිය නීති නිළධාරිනී
විගණකවරු	-	විගණකාධිපති
බැංකු කරුවන්	-	ලංකා බැංකුව සම්පත් බැංකුව ජාතික සංවර්ධන බැංකුව
ලියාපදිංචි කාර්යාලය	-	අංක 42 , නවම් මාවත කොළඹ 02.

අපනයන කාර්යසාධනය 2020

1. ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනය 2020

පෙර වසර හා සැසැඳීමේදී 2020 වසරේදී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලි. 10,047 දක්වා 15.85% කින් අඩුවිය.

ඉපැයීම් අඩු වූ ප්‍රධාන අපනයනයන්

- ඇඟළුම් හා රෙදිපිළි **(21.01%)**
- තේ **(7.83%)**
- රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන **(9.66%)**
- විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග **(13.87%)**

ඉපැයීම්වල වර්ධනයක් වාර්තා වූ නිෂ්පාදන

- පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන **(8.27%)**
- කුළුබඩු හා සාන්ද්‍ර ද්‍රව්‍ය **(7.12%)**
- වෙනත් අපනයන භෝග **(49.27%)**

1.1. ශ්‍රී ලංකාවේ මාසික වෙළඳ භාණ්ඩ අපනයන කාර්යසාධනය



1.2. 2020 වසරේදී වෙළඳ භාණ්ඩ අපනයනයේ සංයුතිය

1.2. වෙළඳභාණ්ඩ අපනයනයේ සංයුතිය 2020



2019 හා 2020 වර්ෂයන්හි අපනයනයන් පිළිබඳ සන්සන්දනයක් පහත වගුවෙන් දැක්වේ. ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 62.5%ක් මූලික අපනයන ගමනාන්ත 10 කෙරෙහි යොමුවී ඇත. ඇ.එ.ජනපදය තනි ගමනාන්තයක් ලෙස මුළු අපනයනයෙන් 24.95% සඳහා දායකවේ.

1.3. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අපනයන ගමනාන්ත 10

	රට	2019 ජන. - දෙසැ. (ඇ.ඩො.මි)	2020 ජන. - දෙසැ. (ඇ.ඩො.මි)	% වර්ධනය	2020 අපනයනයන්හි % කොටස
1	එක්සත් ජනපදය	3139.49	2,507.20	-20.14	24.95
2	එක්සත් රාජධානිය	997.90	910.47	-8.76	9.06
3	ඉන්දියාව	758.97	604.50	-20.35	6.02
4	ජර්මනිය	645.74	570.39	-11.67	5.68
5	ඉතාලිය	531.06	457.32	-13.89	4.55
6	බෙල්ජියම	352.14	295.48	-16.09	2.94

	රට	2019 ජන. - දෙසැ. (ඇ.ඩො.මී)	2020 ජන. - දෙසැ. (ඇ.ඩො.මී)	% වර්ධනය	2020 අපනයනයන්හි % කොටස
7	නෙදර්ලන්තය	300.89	290.17	-3.56	2.89
8	චීනය	229.06	223.00	-2.65	2.22
9	කැනඩාව	240.49	213.05	-11.41	2.12
10	තුර්කිය	209.58	208.38	-0.57	2.07
	වෙනත් වෙළඳපල	4534.68	3,767.34	-16.93	37.50
	එකතුව	**11,940.00**	**10,047**	**-15.60**	**100.00**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව / ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2019 හා 2020 වර්ෂයන්හි අපනයනයන් පිළිබඳ සන්සන්දනයක් පහත වගුවෙන් දැක්වේ. ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 31.67%ක් සඳහා යුරෝපීය සංගමය දායක වන අතර ඇ.එ.ජ.මුළු අපනයනයෙන් 24.95% සඳහා දායකවේ.

1.4. ශ්‍රී ලංකාවේ අපනයන කලාපයන්

කලාපය	2019 ජන. - දෙසැ. (ඇ.ඩො.මී)	2020 ජන. - දෙසැ. (ඇ.ඩො.මී)	% වර්ධනය	2020 අපනයනයන්හි % කොටස
යුරෝපීය සංගමය	3,548.87	3,182.06	-10.34	31.67
එක්සත් ජනපදය	3,139.49	2,507.20	-20.14	24.95
දකුණු ආසියාව	1,123.83	916.17	-18.48	9.12
ආසියාන් රටවල්	407.10	283.44	-30.38	2.82
CIS රටවල්	275.27	269.66	-2.04	2.68
අප්‍රිකානු රටවල්	258.04	245.83	-4.73	2.45
මැද පෙරදිග (සයිප්‍රසය හා ඊජිප්තුව හැර)	904.82	708.59	-21.69	7.05
වෙනත්	2282.58	1,934.05	-15.27	19.25
එකතුව	**11,940.00**	**10,047.00**	**-15.85**	**100.00**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව / ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

1.5. සේවාවන් අපනයනය

පසුගිය වසරේ අදාල කාලසීමාව තුල වාර්තාවූ අගය වන ඇ.ඩො.මිලි. 3,888 හා සැසඳීමේදී 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලසීමාව තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලියන් බැහැරින් ඉටුකරවා ගැනීම (ICT/BPM), ඉදිකිරීම්, මූල්‍ය සේවාවන් සහ ප්‍රවාහන හා සැපයුම් සේවාවන් අතුලත් සේවා අපනයනයෙන් ලද ඉපැයීම් ඇ.ඩො.මිලි. 2,288ක් දක්වා ලඟාවී ඇත. පසුගිය වසරේ අදාල කාලසීමාව හා සැසඳීමේදී 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලසීමාව තුල සේවා අපනයනය 41.15% දක්වා අඩුවී ඇත.

1.6. සංශෝධිත අපනයන පුරෝකථනය හා ළඟාකරගත් ප්‍රගතිය



2020 වසර සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ සංශෝධිත අපනයන පුරෝකථනය වන ඇ.ඩො.බිලියන 13.39න් ඇ.ඩො.බිලියන 9.57ක් වෙළඳ භාණ්ඩ අපනයනයෙන්ද ඇ.ඩො.බිලියන 3.82ක් සේවා අපනයනයෙන්ද අපේක්ෂා කරනු ලැබීය. 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලසීමාව තුල ඇ.ඩො.බිලියන 12.34 අපනයන ඉපැයීම් වාර්තාවේ. එය සංශෝධිත අපනයන පුරෝකථනයෙන් 92.16 %ක ප්‍රගතියකි.

තවද, 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලසීමාව තුල වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයෙන් ලද ඉපැයීම් පිළිවෙලින් 104.97% හා 59.96% ක ප්‍රගතියක් ලඟා කරගනු ලැබීය.

2.7. 2020 සංශෝධිත අපනයන පුරෝකථනය හා ළඟාකරගත් ප්‍රගතිය

නිෂ්පාදනය	අපනයන පුරෝකථනය (ඇ.ඩො.මිලි)	2020 අපනයනයන් (ඇ.ඩො.මිලි)	ලඟාකරගත් ප්‍රගතිය. %
ඇඟළුම්	4,109 *	4,405.84	107.22
තේ	996	1,240.94	124.59
රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන	686	816.17	118.98
පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන	538 *	664.54	123.52
දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ	233	148.23	63.62
විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග	322	328.28	101.95
කුළු බඩු හා සගන්ධ තෙල්	300 *	335.47	111.82
ආහාර හා පාන වර්ග	325	351.36	108.11
මුහුදු ආහාර	188	189.80	100.96
විසිතුරු මසුන්	11	13.03	118.45
එළවළු හා පළතුරු	52	61.34	117.96
වෙනත් අපනයන භෝග	69	67.59	97.96
මල් හා විසිතුරු ශාක	13	12.61	97.00
බෝට්ටු නිෂ්පාදන	53	2.39	4.51
පෙට්‍රෝලියම් නිෂ්පාදන	376	271.80	72.29
වෙනත් වෙළඳ භාණ්ඩ අපනයනයන්	1,300	1,137.61	87.51
වෙළඳ භාණ්ඩ අපනයනයේ එකතුව	**9,571**	**10,047**	**104.97**
තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි	1,600 *	1,011	63.19
ඉදිකිරීම්	74 *	7	9.46
මූල්‍ය සේවාවන්	292	96	32.88
ප්‍රවාහන හා සැපයුම් සේවා	1,850	1,174	63.46
සේවා අපනයනයේ එකතුව	**3,816**	**2,288**	**59.96**
භාණ්ඩ හා සේවා අපනයනයේ එකතුව	**13,387**	**12,335**	**92.14**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව / ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

***කර්මාන්ත ප්‍රතිචාර මත පදනම්ව.**

2. 2020 ජන. - දෙසැ. දක්වා වන කාලසීමාව තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය.

2.1. වෙළඳපල සංවර්ධනය.

2.1.1. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය.

පහත සඳහන් ප්‍රදර්ශනයන් හි වෙළඳකුටි සංවිධානය කරනු ලැබිය:

- සමාගම් 27ක සහභාගිත්වය ඇතිව 2020 පෙබරවාරි 16 - 20දින දක්වා ඩුබායිහි GULFOOD 2020 ප්‍රදර්ශනයේදී ඇ.ඩො. මිලි. 4.5ක වටිනාකමකින් යුත් ඇණවුම් ලබාගැනීමට හැකිවිය.
- 2020 පෙබරවාරි 16 සිට 20 දින දක්වා ජර්මනියේ නියුරම්බර්ග්හිදී පැවති BIOFACH 2020 ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන යුරෝපීය සංගමයේ රටවල වෙළඳපලෙහි ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සමාගම් 14ක සහභාගිත්වය සංවිධානය කළ අතර එහි දී ඇ.ඩො.මිලි.4.5ක වටිනාකමකින් යුත් ඇණවුම් ලබාගැනීමට හැකිවිය.
- 2020 ජනවාරි 18 - 26 දින දක්වා ජර්මනියේ පැවති DUSSELDORF BOAT SHOW 2020 සඳහා සමාගම් 03ක් සහභාගි වූ අතර සහයෝගීතා ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආරම්භ කිරීමට උනන්දුවක් දැක්වූ නෙදර්ලන්ත නිෂ්පාදන හවුල්කරුවකු සමග සම්බන්ධතා ඇතිකර ගැනීමට එක් සමාගමකට හැකිවිය.





- තෙවන China International Import Exposition (CIIE) 2020 හිදී ව්‍යවසාය ව්‍යාපාර වේදිකාවන්
  - ආහාර හා කෘෂිකාර්මික අංශයේ සමාගම් 6ක් හා පාරිභෝගික භාණ්ඩ අංශයේ එක් සමාගමක නියෝජිතයින් හරහා ශ්‍රී ලංකා ව්‍යාපාර ප්‍රදර්ශන කුටිය සංවිධානය කරනු ලැබිය.
  - පොල්, කුළුබඩු, ශාකසාර නිෂ්පාදන, රසකැවිලි හා බිස්කට් වැනි විභව්‍යතාවයක් ඇති වෙනත් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ආහාර හා කෘෂිකාර්මික අංශය යටතේ වර්ග මීටර් 18ක බිම් ප්‍රමාණයකින් යුත් ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ප්‍රදර්ශන කුටිය සංවිධානය කරනු ලැබිය.
  - ප්‍රදර්ශනයේදීම ඇ.ඩො. 5,000 ක පමණ අලෙවියක් සිදුවිය.

- ශ්‍රී ලාංකීය සමාගම් 3ක් හා JD.com අතර යුවාන් මිලියන 5.5 ක වටිනාකමකින් යුත් උපායමාර්ගික සහයෝගිතා ගිවිසුම් තුනක් අත්සන් කරනු ලැබීය.
- මෙම ප්‍රදර්ශනයට සමගාමීව බැන්ක් ඔෆ් චයිනා (Bank of China) සමග මාර්ගගතව ගැලපීම් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය. (සහභාගි වූ මුළු ගනුදෙනුකරුවන් සංඛ්‍යාව - 20, මුළු B2B ව්‍යාපාරික සාකච්ඡා සංඛ්‍යාව - 39 හා ගැණුම්කරුවන් සමග අත්සන් කරනු ලැබූ ගිවිසුම් සංඛ්‍යාව - 10).



2.1.2. රටින් පිටතට හා රට තුලට වෙළඳ දූත මණ්ඩල

පහත පරිදි B2B වෙළඳ සාකච්ඡා සංවිධානය කරනු ලැබීය;

<u>**පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන**</u>

- **ජපානය - කොහුබත් හා පොල්කටු අඟුරු** - ශ්‍රී ලාංකීය සමාගම් 04ක් සඳහා ජපානයේ ගැනුම්කරුවකු හඳුන්වා දෙනු ලැබීය. සමාගම් දෙකක් විසින් සාම්පල යවනු ලැබූ අතර එක් සමාගමකට ඇ.ඩො. 3,880.00ක් වටිනා ඇණවුම් ලැබුණි.
- **එක්සත් රාජධානිය - පොල්කිරි හා වැනිලා** - ශ්‍රී ලාංකීය සමාගම් 05ක් සඳහා එක්සත් රාජධානියේ ගැනුම්කරුවකු හඳුන්වා දෙනු ලැබීය. සාම්පල යවා ඇති අතර ගැනුම්කරුගේ ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.
- **තුර්කිය - වියළි පොල්, කොහුබත් සහ සක්‍රීය කාබන් හා සුදු පොල් තෙල්** - තුර්කි ගැනුම්කරුවන් 13 දෙනෙක් සඳහා ශ්‍රී ලාංකීය සමාගම් 33ක් හඳුන්වා දෙනු ලැබීය. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන මිල ඉහල බව ගැනුම්කරුවන් බොහෝ දෙනෙකුගේ මතයයි. B2B වෙළඳ සාකච්ඡා හරහා හඳුන්වාදෙනු ලැබූ ශ්‍රී ලාංකීය සමාගම් කීපයක් විසින් තුර්කි රජයේ ව්‍යාපෘතියකට අගය එක්කල කොහුබත් නිෂ්පාදන සැපයීම සඳහා තුර්කි හවුල්කරු සමග සාකච්ඡා කරමින් සිටී.

<u>**කුළුබඩු හා සාන්ද්‍රිත නිෂ්පාදන**</u>

- ඇ.එ.ජ. ගැනුම්කරුවන් හා අපනයන සමාගම් 12ක් අතර B2B වෙළඳ සාකච්ඡා පැවැත්වීය. සාම්පල යවා ඇති අතර සාකච්ඡා සිදුකෙරෙමින් පවතී.
- ජපානය, එක්සත් ජනපදය හා දකුණු අප්‍රිකාව යන රටවල් සඳහා මාර්ගගත වෙළඳ සාකච්ඡා 3ක් පවත්වනු ලැබීය.

- අපනයනකරුවන් 12 දෙනෙකු හා පෝලන්ත ගැණුම්කරුවන් 7 දෙනෙකු අතර B2B වෙළඳ සාකච්ඡා සඳහා පහසුකම් සලසනු ලැබීය.
- ජෝර්දානය සමග B2B වෙළඳ සාකච්ඡා සඳහා අපනයනකරුවන් 3 දෙනෙකු හඳුන්වාදෙනු ලැබීය.
- **ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශක (GI)**
  - ලංකා කුරුඳු හඳුනා ගැනීමේ හැකියාව හා අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය ස්ථාපනය කිරීම.
  - GI සංගමයේ කාර්යයන් අධීක්ෂණය කිරීම හා අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.
  - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.
  - මහජන අදහස් දැක්වීම සඳහා 2020 ජූනි මාසයේදී යුරෝපීය සංගම් ජර්නලයේ ලංකා කුරුඳු GI අයදුම් කිරීම පළකරනු ලැබීය.

<u>ඇඟළුම් අංශය</u>

- ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගීතාවය ඇතිව ශ්‍රී ලාංකීය ඇඟළුම් සමාගම් 9ක් සඳහා ප්‍රංශයේ Lacoste සමාගම සමග B2B වෙළඳ සාකච්ඡාවක් පවත්වනු ලැබීය. එක් එක් සමාගම විසින් ඇණවුම් සම්බන්ධයෙන් Lacoste සමාගම සමග සන්නිවේදනය කරමින් සිටී.
- ශ්‍රී ලාංකීය ඇඟළුම් සමාගම් 6ක් සඳහා පෝලන්ත ගැණුම්කරුවන් 3දෙනෙක් සමග B2B වෙළඳ සාකච්ඡාවක් සංවිධානය කරනු ලැබීය.

<u>බෝට්ටු නිෂ්පාදනය කිරීම</u>

- මැද පෙරදිග හා අප්‍රිකානු කලාපීය රටවල ශ්‍රී ලාංකීය දූත මණ්ඩල නියෝජිතයින් සඳහා බෝට්ටු නිෂ්පාදන අංශයේ මාර්ගගත වෙළඳ සාකච්ඡා 2ක් සංවිධානය කරනු ලැබීය.
- ස්විඩන ගැණුම්කරුවකු හා බෝට්ටු නිෂ්පාදන අංශයේ නියෝජිතයින් සමග මාර්ගගත වෙළඳ සාකච්ඡා පවත්වනු ලැබූ අතර එක් බෝට්ටු නිෂ්පාදන සමාගමක් සමග සහයෝගිතාවය ඇතිකර ගැනීම සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී.
- ඕමාන ගැණුම්කරුවකු වන Al Firuz Group හා බෝට්ටු නිෂ්පාදන සමාගම් 03ක් සමග B2B වෙළඳ සාකච්ඡාවක් පවත්වනු ලැබීය.
- ඕමාන ගැණුම්කරුවකු වන Al Hilal Group හා බෝට්ටු නිෂ්පාදන සමාගම් 04ක් සමග B2B වෙළඳ සාකච්ඡාවක් පවත්වනු ලැබීය. ඕමාන ගැණුම්කරුවන් සමග සහයෝගිතාවක් ඇතිකර ගැනීම සඳහා එක් එක් සමාගම මගින් ලැබුණු යෝජනා ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබීය. ගැණුම්කරුවන් සමග පසු විපරම් සිදුකරමින් පවති.
- තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සම්බන්ධීකරණය ඇතිව තුර්කි ගැණුම්කරුවකු හා ශ්‍රී ලංකා නැව් නිෂ්පාදන සමාගම සමග B2B වෙළඳ සාකච්ඡාවක් පවත්වනු ලැබීය. ඇතිකරගත

හැකි සහයෝගීතාවයන් පිළිබඳ යෝජනා ගැණුම්කරු වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර සමාගම විසින් ඒ පිළිබඳ පසුවිපරම් කරමින් සිටී.

<u>සෙරමික් හා බඳුන් ආශ්‍රිත නිෂ්පාදන</u>

- සමාගම් නියෝජිතයින් හා ඇ.එ.ජ. දූත කණ්ඩායම් නිලධාරින් අතර එක් මාර්ගගත සාකච්ඡාවක් පවත්වනු ලැබීය.
- එක්සත් රාජධානියේ ප්‍රංශයේ හා ස්වීඩනයේ දූත කණ්ඩායම් වල නිලධාරින් සමග ජූලි මාසයේදී මාර්ගගත සාකච්ඡාවක් පවත්වනු ලැබීය. සමාගම් 3ක් සමග පසුවිපරම් සිදුකරමින් පවතී.
- ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ලෙඩ් අම්ල බැටරිය හා ලිතියම් අයන් බැටරි ප්‍රවර්ධනය කිරීම සඳහා තායිලන්තයේ ටොයොටා හා පැනසොනික් සමාගම් නියෝජිතයින්, තායිලන්තයේ ශ්‍රී ලංකා දූත මණ්ඩල නිලධාරින්, SLINTEC නියෝජිතයින්, Ceylon Graphene Technologies හා අපනයන සංවර්ධන මණ්ඩල නියෝජිතයින් සමග මාර්ගගත සාකච්ඡාවක් පවත්වනු ලැබීය. එක් එක් සමාගම විසින් ශ්‍රී ලංකා දූත කණ්ඩායම් හා අදාල රටවල ගැණුම්කරුවන් සමග සන්නිවේදනය කරමින් සිටිති.

<u>විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග</u>

- චෙන්නායි, ඉන්දියාව, මුම්බායි, නව දිල්ලිය, මැලේසියාව, සිංගප්පූරුව, තායිලන්තය හා වියට්නාමය යන විදේශීය දූත මණ්ඩල 8 සමග මාර්ගගතව සම්මන්ත්‍රණයක් පැවැත්වූ අතර දැනට ඇ.ඩො.මිලි.1.6ක (2016 -2018 දක්වා) කෝන්ත්‍රාත් ලබා ගෙන ඇත. ඇ.ඩො.මිලි.4ක් සම්බන්ධයෙන් සාකච්ජා සිදු කෙරේ.
- සිංගප්පූරු තානාපති කාර්යාලය මගින් ඩිජිටල් ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලාංකීය සමාගම් 15ක විස්තර මෙන්ම වෙබ් බැනරයක් සිය වෙබ් පෝටලයේ පළකිරීමට කටයුතු කරනු ලැබූ අතර මෙමගින් 2021 වනවිට ඇ.ඩො.මිලි.0.8ක ව්‍යාපාරික සම්බන්ධතා ගොඩනගා ගැනීමට අපේක්ෂිතය.
- ඉන්දියානු විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදයින්ගේ සංගමය (IEEMA) සමග 2020 ඔක්තෝබර් 05 සිට 9 දක්වා B2B වෙළඳ සැසියක් පවත්වනු ලැබිය.
- ඉලෙක්ට්‍රොනික අපනයනකරුවන් සඳහා ජර්මනියේ හා යුරෝපයේ ඇති වෙළඳපල අවස්ථා පිළිබඳ මාර්ගගත සමුළුවේදී ඇ.ඩො.මිලි.2.7ක කෝන්ත්‍රාත් ලබාගෙන ඇති අතර ඇ.ඩො.මිලි.12ක ඇණවුම් සම්බන්ධයෙන් සාකච්ජා කෙරෙමින් පවතී.

<u>විවිධ නිෂ්පාදන</u>

- ඊජිප්තුවේ හා ජෝර්දානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සහයෝගීතාවය ඇතිව 2020 පෙබරවාරි මාසයේදී රටින් පිටතට දූත මෙහෙයක් සංවිධානය කරනු ලැබීය. එක් සමාගමක් මේ වන විටත් නව ගැණුම්කරුවකු සඳහා සැපයුම් කරනු ලබන අතර දැන් ජෝර්දානයට කාබනික

තේ අපනයනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටී. අනෙක් සමාගම් ගැණුම්කරුවන් සමග සාකච්ඡා කරමින් සිටී.

- පෝලන්තයේ පැවති විද්යුත්-වෙළඳ සතිය - මේ සඳහා ශ්‍රී ලාංකීය සමාගම් 19ක් සහභාගි විය. කුළුබඩු, පොල් මද නිෂ්පාදන හා ඇඟළුම් අංශ සම්බන්ධයෙන් පෝලන්ත ගැණුම්කරුවන් 10 දෙනෙකු සමග සාකච්ඡා 24ක් පැවැත්වුණි. සමාගම් 2ක් ඔවුන්ගේ මුල් ඇණවුම් යවා ඇති අතර අනෙක් සමාගම් ගැණුම්කරුවන් සමග සාකච්ඡා සිදු කරමින් සිටී.
- බ්‍රසීලය හා චිලී යන රටවල ඇඟළුම්, බීර, කුළු බඩු හා තේ යන අංශයන්හි B2B ව්‍යාපාරික සාකච්ඡා 26ක් සංවිධානය කෙරිණ.
- එක් සමාගමකට චිලි රටෙන් පොල් කෙඳි සඳහා තහවුරු වූ ඇණවුමක් ලැබිණ.
- 2020.09.25 දින සිංගප්පූරුව සමග B2B වැඩසටහනක් පැවැත්විණ - මේ සඳහා ශ්‍රී ලාංකීය සමාගම් 10ක් හා සිංගප්පූරු ගැණුම්කරුවන් 6 දෙනෙක් සහභාගි විය. ශ්‍රී ලාංකීය සමාගම් 3ක් එම ස්ථානයේදිම සාර්ථක ලෙස සාකච්ඡා සිදුකරනු ලැබීය.
- නේපාලය සමග B2B සාකච්ඡා - දන්කොටුව පෝසිලේන් හා නොරිටාකේ ලංකා පෝසිලේන් ප්‍රයිවට් ලිමිටඩ් හා නේපාලයේ Nimbus Holdings සමග B2B ව්‍යාපාරික සාකච්ඡා පැවැත්විණ.
- පකිස්ථානයේ ඉස්ලාමාබාද්හි පැවති B2B සාකච්ඡා - පෝසිලේන්, මැණික් හා ස්වර්ණාභරණ, පිරිසැකසුම්කරන ලද ආහාර, කුළුබඩු හා ශාකසාර විලවුන් අංශයන්හි සමාගම් 35ක විස්තර හා අත්පත්‍රිකා යවනු ලැබිය.
- චීනයේ කුන්මින්ග්හි මාර්ගගතව පැවති China South Asia Expo – 2020 දෙසැම්බර් 12 සිට 18 දින දක්වා පැවති මෙම ප්‍රදර්ශනයේදී මැණික් හා ස්වර්ණාභරණ, සකස් කළ ආහාර කෂේත්‍ර නියෝජනය කරමින් සමාගම් 22ක් සහභාගි විය.
- තුර්කියේ Foreign Economic Relations Board (DEIK) සහයෝගීතාවය ඇතිව “Interconnected Business series between Turkey and Sri Lanka” යන මැයෙන් සංවිධානය කරනු ලැබූ මාර්ගගත සමුළුවෙන් පසුව රටවල් දෙකෙහි පෞද්ගලික අංශය අතර පැවති ආංශික අන්‍යෝන්‍ය සැසිවාර පැවැත්විණ. මේ සඳහා ආහාර හා පාන වර්ග, රබර් හා රබර් නිෂ්පාදන, කැටි නූල්, සක්‍රිය කාබන්, ආයුර්වේද නිෂ්පාදන සහ කොහුබත් හා ඉදිකිරිම් අංශයන්හි ශ්‍රී ලංකිය සමාගම් 88ක් සහභාගි විය.

2.1.3. ශක්‍යතා අධ්‍යයන /වෙළෙඳපළ බුද්ධිමය තොරතුරු (Market Intelligence)

- COVID 19 බලපෑම් සහ වෙළඳපල අවස්ථා පිළිබඳව දැනුවත්භාවය ඇතිකිරීම සඳහා පිටරට වල ශ්‍රී ලාංකීය දූත කණ්ඩායම්වල සහය ඇතිව අලෙවි වාර්තා 59ක් සම්පූර්ණ කර අපනයන සංවර්ධන මණ්ඩලීය වෙබ් අඩවියේ පලකරනු ලැබීය.
- යුරෝපය සඳහා මත්ස්‍ය අංශය පිළිබඳ අලෙවි වාර්තාවක් නිමකරනු ලැබීය.

- වාණිජ දෙපාර්තමේන්තුවේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය ඇතිව කුළුබඩු හා සාන්ද්‍ර ද්‍රව්‍ය සඳහා අලෙවි වාර්තා සකස්කර පාර්ශවකරුවන් අතර බෙදාහරිනු ලැබූ අතර අපනයන සංවර්ධන මණ්ඩලීය වෙබ් අඩවියේ (රුසියාව, කැනඩාව හා එක්සත් අරාබි එමිර් රාජ්‍යය) පල කරනු ලැබීය.
- රොමානියා හා ස්ලෝවෙකියා අලෙවි අධ්‍යයන නිමකර අපනයන සංවර්ධන මණ්ඩලීය වෙබ් අඩවියේ පල කරනු ලැබීය.
- US GSP+ ආවරණය පුළුල්කිරීම සඳහා සුදුසු නිෂ්පාදන හඳුනාගැනීම පිණිස සංඛ්‍යාලේඛණ විශ්ලේෂණය මගින් අධ්‍යයනය කරන ලදී.
- මෙම මෙවලම යොදාගෙන සකස්කරන ලද සංඛ්‍යාලේඛණ වාර්තා විදේශයන්හි ශ්‍රී ලාංකීය දූත කණ්ඩායම්, අපනයනකරුවන් ඇතුළු අදාල පාර්ශවකරුවන් සමග හුවමාරු කරගනු ලැබීය.
- "Import substitution framework for domestic industry development" යන මැයෙන් වන විස්තරාත්මක අධ්‍යයනය හා වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයට යවනු ලැබීය.

2.1.4. ශ්‍රී ලංකාව අන්තර්ජාතිකව නිරාවරණය කිරීම සඳහා වැඩසටහන්

- ජර්මනියේ ආනයන ප්‍රවර්ධන පිළිබඳ ආයතනයේ (IPD) සහයෝගිතාවය ඇතිව පැවති නිරාවරණ වැඩසටහන.
- SIAL-2020 ප්‍රදර්ශනයේ ශ්‍රී ලාංකීය සහභාගීත්වය ඉලක්කකර විශේෂ මාර්ග සිතියමක් සකස්කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලීය නිලධාරීන් 15 දෙනෙකු සඳහා දින දෙකක වැඩමුළුවක් පවත්වනු ලැබීය.
- IPD ආයතනයේ විශේෂඥයින් විසින් අපනයන සංවර්ධන මණ්ඩලීය කණ්ඩායම සඳහා පසු විපරම් කටයුතු පිළිබඳව මාර්ගගත සාකච්ඡා 5ක් සිදුකරනු ලැබූ අතර ඉදිරිපත් කිරීමක්ද කරනු ලැබීය.
- SIAL-2020 සඳහා සහභාගිවීම අවලංගුවීමත් හේතුවෙන් පූර්ව-ප්‍රදර්ශන වැඩමුළු 2021 වෙළඳ ප්‍රදර්ශන නැවත වැඩසටහන්ගත කරනු ලැබීය.
- IPD ආයතනයේ විශේෂඥයින් විසින් අපනයන සංවර්ධන මණ්ඩලීය නිලධාරීන් සඳහා ‘How to prepare and conduct Virtual B2B meeting’ හා How to prepare exporters for virtual B2B programme යන මාර්ගගත සමුළු දෙකක් පවත්වනු ලැබීය.
- අපනයන සංවර්ධන මණ්ඩලීය නිලධාරීන් 40 දෙනෙකු සඳහා "Organization of Trade Fairs" පිළිබඳ වැඩමුළුවක් පවත්වනු ලැබීය.
- තෝරාගත් මල් වගාකරුවන් 33 දෙනෙකුගේ හා අපනයන සමාගමක සහභාගිත්වය ඇතිව අපනයන වැඩපිළිවෙල පෙන්වාදීම සඳහා 2020 ජනවාරි 14 දින එක් වැඩමුළුවක් පවත්වනු ලැබීය.

2.1.5. වෙනත් වෙළඳපල සංවර්ධන වැඩසටහන්

- චීනයේ B2C හා B2B විද්‍යුත් වාණිජ්‍ය වේදිකාව වන www.womai.com හරහා ශ්‍රී ලංකාව හා පෞද්ගලික අංශයේ සමාගම් ප්‍රවර්ධනය සඳහා චීනයේ COFCO Womai Investment Pvt සමග අපනයන සංවර්ධන මණ්ඩලය අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.
- පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා විද්‍යුත්-ප්‍රවර්ධන ද්‍රව්‍ය සකස්කර ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල සමග හුවමාරු කරගනු ලැබීය.
- ශ්‍රී ලංකාවේ ස්වස්ථ සංචාරක සේවාව (Wellness Tourism) ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ස්වස්ථ සංචාරක සංගමයේ සහයෝගීතාවය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2020 ජූලි 03, 07 හා 10වන දිනවල මාර්ගගත වැඩසටහන් තුනක් සංවිධානය කරනු ලැබිය. ස්වස්ථ සංචාරක කර්මාන්තයට අදාල ජාතික හා ජාත්‍යන්තර විශේෂඥයින් 4දෙනෙකු සම්පත්දායකයින් ලෙස කැඳවනු ලැබූ මෙම මාර්ගගත සමුළු මාලාවන් තුන සඳහා ජාතික/ජාත්‍යන්තර වශයෙන් 700 දෙනෙකු පමණ සහභාගි විය. තවද ඩිජිටල් මාධ්‍ය හරහා පළකරනු ලැබූ අතර අන්තර්ජාලය හරහා ස්වස්ථ කර්මාන්තය පිලිබඳ උනන්දුවන 50,000 දෙනෙකු පමණ මෙම වැඩසටහන නරඹා ඇත.
- නැගෙනහිර ආසියානු, යුරෝපිය හා දකුණු අප්‍රිකානු රටවල ශ්‍රී ලාංකීය දූත කණ්ඩායම් සම්බන්ධ කරමින් සැපයුම් අංශය සඳහා මාර්ගගත සමුළු දෙකක් පැවැත්විය. ඉන්දියානු හා දකුණු අප්‍රිකානු රටවල දූත කණ්ඩායම් ඔවුන්ගේ වෙළඳපල සඳහා ව්‍යාපාරික සම්බන්ධතා ඇතිකර ගැනීමට කැමැත්තක් දැක්වීය.
- කාර්ය උපාය සේවා සැපයුම් අංශය සඳහා මාර්ගගත සාකච්ඡා 2ක් පවත්වනු ලැබීය. ඇත ආසියානු රටවල් සඳහා පැවැත්වූ මෙම වැඩසටහන් දෙකේදී කේන්ද්‍රස්ථාන මෙහෙයුම්කරුවන්ට ඔවුන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව සැලසිනි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දෙසැම්බර් 16 දින ඉන්දියාවේ Indian Exporters Organization (FIEO) සමග B2B සාකච්ඡාවක් පැවැත්විණ. මාර්ගගත සාකච්ඡාවෙන් පසුව ශ්‍රී ලංකාවේ සැපයුම් කර්මාන්තය (Logistic industry) පිළිබඳව කෙටි විස්තරයක් පළකිරීමට FIEO එකඟවිය.
- ශාකසාර විලවුන් නිෂ්පාදන සඳහා ශ්‍රී ලාංකීය ප්‍රමිතීන් සකස් කිරීම හා සායනික පරීක්ෂණ සිදුකිරීම පිළිබඳව කටයුතු කෙරේ.
- ආයුර්වේද නිෂ්පාදන සඳහා ශ්‍රී ලාංකීය ප්‍රමිතීන් සකස් කිරීම පිළිබඳව කටයුතු කෙරේ.
- ජපානය, එක්සත් රාජධානිය හා දකුණු අප්‍රිකාව යනා දී රටවලට ශාකසාර විලවුන් අංශය සඳහා මාර්ගගත සාකච්ඡා 3ක් පවත්වනු ලැබීය.
- ශාකසාර විලවුන් නිෂ්පාදන සඳහා ජපානයේ හා එක්සත් රාජධානියේ ගැණුම් කරුවන් හා සම්බන්ධ වීම, නෙදර්ලන්තයේ හා බැරන්ට් ගැණුම්කරුවන් හා සම්බන්ධවී එම සමාගම් වලට සාම්පල යවනු ලැබීය.
- ක්ෂණිකව ආහාරයට ගත හැකි ශීතකල නිෂ්පාදන සඳහා නිෂ්පාදන හා වෙළඳපල සංවර්ධන වැඩසටහන්.

- වෙළඳපල විපරම් 17ක් පළකරනු ලැබීය.
- ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය පිළිබඳව එක් එක් දූත කණ්ඩායමේ නිලධාරීන්ගේ දැනුවත්භාවය ඉහල නැංවීම සඳහා විදේශීය දූත කණ්ඩායම් 5ක් සඳහා විස්තරාත්මක මාර්ගගත සමුළුවක් පවත්වනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහය ඇතිව ඉන්දියානු ගැනුම්කරුවන් දෙදෙනෙකු සමග B2B සාකච්ඡා පවත්වනු ලැබීය. සිංගප්පූරුවේ ශ්‍රී ලාංකීය දූත කණ්ඩායම්වල සහය ඇතිව PrintPack+Sign 2020 (2020 ඔක්තෝබර් 28 සිට 30 දින දක්වා) සඳහා මාර්ගගතව සහභාගිවීමට සහය දෙනු ලැබීය.
- අන්තරාල වෙළඳාම ක්‍රමවේදය සකස්කර අවසන්ව ඇති අතර නිරීක්ෂණ සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත්කර ඇත.
- ඕමාන් වෙළඳපලෙහි ශ්‍රී ලංකිය ආහාර ප්‍රවර්ධනය කිරීම සඳහා ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා SPAR සුපිරි වෙළඳසැල් ජාලය සමග කටයුතු කරනු ලැබීය .
- කාබනික/ එදිනෙදා අත්‍යවශ්‍ය නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමග කටයුතු කරනු ලැබීය. සමාගම් 08ක සාම්පල තානාපති කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබීය. ශ්‍රී ලාංකීය සමාගම් 04 හා “Three by One” යන ආහාර අපනයන ආයතනය සමග එක් සාකච්ඡාවක් පවත්වනු ලැබීය.
- එක් ඇ.එ.ජ. ගැනුම්කරුවකු හා ශ්‍රී ලංකිය ආහාර නිෂ්පාදන අපනයන සමාගම් 07ක් සමග B2B සාකච්ඡා සිදු කරනු ලැබීය.
- කොස් අපනයනය කරන සමාගමක් සඳහා එක්සත් රාජධානියේ ගැණුම්කරුවකු හඳුන්වාදෙනු ලැබීය.
- “Grow Pot” හා “Foreign Investor Out Reach” යනා දී උපායමාර්ගයන් මගින් අපනයන සංවර්ධන මණ්ඩලය හා ආයෝජන මණ්ඩලය ඒකාබද්ධව පිහිටුවන ලද කාර්යසාධන බලකා කමිටුව යටතේ ආයෝජන මණ්ඩලයේ සහයෝගීතාවය ඇතිව පහත සඳහන් අංශයන්ට ආයෝජකයින් කැඳවීම සඳහා යෝජනා හඳුනා ගැනීම හා සකස් කිරීම පිලිබඳව කටයුතු කරනු ලැබීය.
  - ✓ රබර් අංශය (ටයර් (සන හා වායු), වාහන අමතර කොටස්)
  - ✓ ඇඟළුම් හා පුද්ගල ආරක්ෂක උපකරණ (PPE)
  - ✓ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ
  - ✓ තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT)
  - ✓ බණිජ ආශ්‍රිත නිෂ්පාදන (ස්ඵටික කාබන් හා ආශ්‍රිත නිෂ්පාදන)
  - ✓ ආහාර පිරිසැකසුම් කිරීම
  - ✓ ඖෂධ අංශය

3. සැපයුම් හා නිෂ්පාදන සංවර්ධනය

- 12 වන පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2020 පෙබරවාරි 07 සිට 09 වන දිනය දක්වා BMICH හිදී පැවැත්විණ. 25,000 පමණ පිරිසක් සහභාගිවූ මෙම ප්‍රදර්ශනයේදී දේශීය ප්‍රදර්ශකයින් 101 හා විදේශීය ප්‍රදර්ශකයින් 27 දෙනෙකු විසින් වෙළඳකුටි 225කදි සිය නිෂ්පාදන ප්‍රදර්ශනය කරනු ලැබීය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සංවිධානය කරනු ලැබූ අපනයන සංවර්ධන මණ්ඩලීය ප්‍රදර්ශන කුටියේදී 10 දෙනෙකු සිය නිෂ්පාදන ප්‍රදර්ශනය කරනු ලැබීය.
- කර්මාන්තයේ නියැලි පාර්ශවකරුවන් 105 දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව ජීවන ක්‍රමයක් ලෙස " බෝට්ටු ආශ්‍රිත වෙළෙඳ ක්‍රීඩා ප්‍රචලිත කිරීම" මැයෙන් සම්මන්ත්‍රණයක් 2020 මාර්තු 04 දින BMICHහිදී සංවිධානය කරනු ලැබීය.





- බටහිර වෛද්‍ය අංශය සම්බන්ධයෙන් නිර්මාණය කරන ලද ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් මියන්මාරයේ සමාජ මාධ්‍ය හා වෙබ් අඩවි හරහා ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා මියන්මාරයේ ශ්‍රී ලංකා දූත කණ්ඩායම් වෙත ලබා දෙනු ලැබීය.
- 'ලංකා කුළුබඩු' සන්නාමය ප්‍රවර්ධනය කිරීම - නිෂ්පාදන 8ක් සඳහා Pure Ceylon Cinnamon (PCC) සළකුණ භාවිතා කිරීම වෙනුවෙන් සමාගම් පහකට නව බලපත්‍ර නිකුත් කරනු ලැබීය. සමාගම් දෙකක් බලපත්‍ර ලබාගැනීමේ කාර්යයේ නිරතව සිටී. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහයෝගිතාවය ඇතිව ලංකා කුරුඳු ශ්‍රී ලංකාවේ කාබනික නියෝග මාලාව සංශෝධනය කිරීමේ කාර්යයේ නිරතව සිටී.
- ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහභාගිත්වය ඇතිව 2020 ජූනි 30 වන දින "POST COVID ECONOMIC RECOVERY: CHALLENGES AND OPPORTUNITIES - TIPS FOR SRI LANKA - EXPERTS VIEWS FROM JAPAN" යන මාර්ගගත සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලැබීය.
- ඖෂධ අංශය සඳහා කාර්යසාධන කමිටුවක් ඇතිකරනු ලැබිය. කමිටු රැස්වීම් 4ක් පවත්වා ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලැබීය. අපනයන සංවර්ධන මණ්ඩලයේ 2021 ක්‍රියාකාරී සැලැස්ම සඳහා ක්‍රියාකාරකම් 04ක් ඇතුලත්කර ඇත.

- අපනයනකරුවන්ට කෙසෙල් වර්ග සැපයුම්කරුවන් හා කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ කෙසෙල් පර්ශදය සමග සම්බන්ධවීම සඳහා පහසුකම් සලසනු ලැබීය.
- මල්වගා අංශය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික අපනයන උපායමාර්ග 2021-2024 සකස් කිරීම.

4. ධාරිතා වර්ධන වැඩසටහන්

- මැයි 25-29 දින දක්වා දිවයින පුරා සිටින උපාධි අපේක්ෂකයින් / ව්‍යවසායකයින් ඉලක්ක කර ඩිජිටල් IT සතිය පවත්වනු ලැබීය.
- මෝටර් රථ කර්මාන්තයේ නියලි 50 දෙනෙකු සඳහා 2020 ජනවාරි 28 දින මෝටර් රථ උපාංග නිෂ්පාදන අංශයේ අවශ්‍යතා, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නව තාක්ෂණික වැඩිදියුණු කිරීම් පිළිබඳ වැඩමුළුවක් පවත්වනු ලැබීය.
- ඇමරිකා එක්සත් ජනපදයේ. අපනයන අවස්ථා පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කරනු ලැබීය.
- අන්තරාල වෙළඳාම ක්‍රියාවලිය කෙටුම්පත වලංගු කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.
- ඉලෙක්ට්‍රොනික අංශය හා සම්බන්ධ පහත ගැටළු විසඳීම සඳහා විදේශ අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය සහ ජාතික ප්‍රසම්පාදන කොමිසම යනාදී ආයතන සමඟ කටයුතු කිරීම.
- උසස් තාක්ෂණය පිලිබඳ දින 02ක මාර්ගගත වැඩමුළුව - ශ්‍රී ලංකාවේ ප්‍රධාන රබර් නිෂ්පාදන සමගම්වල කාර්මික අංශයේ පුද්ගලයින් 70කට වැඩි පිරිසකගේ සහභාගිත්වය ඇතිව 2020 දෙසැම්බර් 18 හා 19 යන දින වලදී රබර් නිෂ්පාදන කර්මාන්තය සඳහා සුහුරු නිෂ්පාදන කිරීම සාර්ථකව සිදුකරනු ලැබීය.



- වෙළඳ හා ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා සැප්තැම්බර් 18 දින අපනයන සංවර්ධන මණ්ඩලය හා පකිස්ථානු මහකොමසාරිස් කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කරනු ලැබූ මාර්ගගත වැඩසටහන සඳහා 82 දෙනෙකු සහභාගි විය.
- 2020/10/7 දින 100 දෙනෙකුට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් ඔස්ට්‍රේලියාවේ සිඩ්නිහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගිතාවය "Potential Export opportunities in Oceania Region" යන මැයෙන් මාර්ගගත සමුළුවක් සංවිධානය කරනු ලැබීය.
- ඇමරිකානු තානාපති කාර්යාල රාජ්‍ය දෙපාර්තමේන්තුවේ (USTR) සහය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලයේ හා වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා US GSP පහසුකම් පිළිබඳ මාර්ගගත සමුළුවක් සංවිධානය කරනු ලැබීය.

- “FDA regulations on PPE and Food and Beverages” යන මැයෙන් වූ මාර්ගගත සමුළුව සඳහා ඇඟළුම් හා පුද්ගලික ආරක්ෂණ උපකරණ (PPE) අංශය සඳහා 55 දෙනෙකු සහ ආහාර හා පාන අංශය සඳහා 85 දෙනෙකු සහභාගී විය.
- විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික උපාංග අංශය හා සම්බන්ධ ගැටළු 05ක් විසඳනු ලැබීය. (තීරුබදු හා සම්බන්ධ ගැටළු, අපනයන සීමා කිරීමේ ගැටළු, සීමාකිරීම් සඳහා අවසර බලපත්‍ර, සැපයුම් ගැටළු, වෙළඳපල සම්බන්ධ කිරීමේ ගැටළු)
- අයවැය මගින් මුද්‍රණ අංශය හා සම්බන්ධ ගැටළු විසඳනු ලැබීය - මුද්‍රණ අමුද්‍රව්‍ය ආනයනය සඳහා තිරුබදු අඩුකිරීම/ ඉවත් කිරීම, අපනයනයන් සඳහා අපනයන පිරිවැටුම්/රුපියල් දිරිදීමනා නොමැතිකම.
- කාබනික සහතිකකරණ වැඩසටහන සඳහා තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා කාබනික සහතිකකරණ වැඩපිළිවෙල හා SLS ප්‍රමිතින්ගේ අන්තර්ගතය පිළිබඳව මාර්ගගත පුහුණු වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය.
- තෝරාගත් ගොවි කණ්ඩායම් 10ක් සඳහා කාබනික සහතිකකරණය සඳහා සහය දෙනු ඇත.

5. අපනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම

- ගනුදෙණුකරුවන් සඳහා HELP DESK ස්ථාපනය කිරීම. මෙමගින් අපනයනකරුවන්, ව්‍යවසායකයින් සහ මහජනතාව සඳහා සහය සේවාවන් පිළිබඳව සහය ලබාදෙනු ලබන අතර වෙනත් අදාල ආයතන සම්බන්ධයෙන් අවශ්‍ය මගපෙන්වීම ලබාදේ.
  - ✓ කොවිඩ් 19-වසංගත තත්වය යටතේ ජාත්‍යන්තර වෙළඳපලෙහි ඇති අපනයන අවස්ථාවන් ග්‍රහණය කරගැනීම වෙනුවෙන් අපනයනයන් සිදුකරන ශ්‍රී ලාංකීය සමාගම් සම්බන්ධ කිරීම සඳහා ශ්‍රී ලංකා දූත කණ්ඩායම් සමග කටයුතු කිරීම .



  - ✓ අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු සඳහා විසඳුම් ලබාදීම ඇතුළුව ඔවුන්ට නැවත ව්‍යාපාරයන්ට යොමුවීම සඳහා පහසුකම් සැලසීම.

- වෙළඳපල විපරම් (Market Alerts)
  - ✓ පිටරටවල ශ්‍රී ලාංකීය දූත කණ්ඩායම්වල සහයෝගිතාවය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලීය වෙබ් අඩවිය හරහා වෙළඳපල විපරම් 59ක් පළකිරීම හා යාවත්කාලීන කිරීම කරනු ලැබූ අතර අපනයනකරුවන්, අදාල ආයතන ආදිය අතර බෙදාහරිනු ලැබිය.

- පවත්වනු ලැබූ පාඨමාලා
  - ✓ අපනයනකරුවන් හා විභව්‍ය අපනයනකරුවන් 41 දෙනෙකු සඳහා ජාත්‍යන්තර වෙළඳාමෙහි මෙහෙයුම් ආභාෂය පිළිබඳ 01 පාඨමාලාවක් පවත්වනු ලැබීය.
  - ✓ 88 දෙනෙකු සඳහා ආනයන අපනයන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත් පාඨමාලා 02ක් පවත්වනු ලැබීය.

- අපනයන හා සම්බන්ධ තොරතුරු බෙදාහැරීම.
  - ✓ Business Lanka Magazine වෙළුම් දෙකක් පලකරනු ලැබූ අතර පිටපත් 1250ක් රටවල් 125ක් අතර බෙදාහරිනු ලැබීය. මෙය ශ්‍රී ලංකාවේ අමාත්‍යවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, විශ්ව විද්‍යාල හා වෙනත් ආයතන අතර ද බෙදාහරිනු ලැබීය.
  - ✓ 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා Expo News මාසික සංස්කරණය අපනයන සංවර්ධන මණ්ඩලීය වෙබ් අඩවියේ පළකරනු ලැබූ අතර ග්‍රාහකයින් 2000කට වැඩි පිරිසක් අතර විද්‍යුත් තැපෑල මගින් සංසරණය කරනු ලැබීය.
  - ✓ 2020 පෙබරවාරි 7 දින සිට 9 දින දක්වා පැවති පාවහන් හා සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනයේදී තොරතුරු කුටියක් සංවිධානය කරනු ලැබ අතර එහි දී අපනයන ක්‍රියාවලිය, තත්ව සහතික, අපනයනය කල හැකි නිෂ්පාදන හා අපනයන වෙළඳපල පිළිබඳ වෙළඳ තොරතුරු ලබාගත හැකිවිය.

- අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු සඳහා විසඳුම් ලබාදීම ඇතුළුව ඔවුන්ට නැවත ව්‍යාපාරයන්ට පිවිසීම සඳහා පහසුකම් සලසනු ලැබීය.
- අපනයනකරුවන්ට නිෂ්පාදන ආරම්භ කිරීමට හා ඇප නොමැතිව 4% පොළී අනුපාත යටතේ කාරක ප්‍රාග්ධන ණය සඳහා ප්‍රවේශ වීමට පහසුකම් සලසනු ලැබීය.
- පිරිසැකසුම් කරන ලද ආහාර අංශය සඳහා පහත සඳහන් මාතෘකා ඔස්සේ වෙළඳපල වාර්තා දෙකක් සකස්කර අපනයනකරුවන් අතර බෙදාහරිනු ලැබීය.

  ඒ) ජර්මන් වෙළඳපල සඳහා ආහාර හා පාන වර්ග අපනයනකරුවන්ට COVID 19 බලපෑම.

  බී) ජපාන වෙළඳපලෙහි බිහිව ඇති වෙළඳපල අවස්ථා.

5.1. මාර්ගගත සම්මන්ත්‍රණ (Webinars)

පහත දැක්වෙන මාර්ගගත සම්මන්ත්‍රණ (Webinars) සංවිධානය කරනු ලැබීය.

- ✓ 2020 ජූනි 24 වන දින ඇ.එ.ජ. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් “USA standards applicable for PPE product” හා " FDA regulations on PPE”.
- ✓ 2020 ජූලි 16 වන දින එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් “Challenges for Sri Lanka’s Exports with BREXIT”.

- ✓ එක්සත් රාජධානිය සඳහා සාමාන්‍ය තීරුබදු යටතේ ශ්‍රී ලංකාව සඳහා වන අවස්ථා සහ අභියෝග.
- ✓ COVID වසංගතයෙන් පසු ආර්ථිකය යථාතත්වයට පත්කිරීම - විද්වත් සමාලෝචනය - ජපානයේ ශ්‍රී ලංකා දූත කණ්ඩායම - 2020 ජූනි 30.
- ✓ එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහයෝගිතාවය ඇතිව ආයුර්වේද නිෂ්පාදන සඳහා එක්සත් රාජධානියේ නියාමන අවශ්‍යතා පිළිබඳ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන. මහ කොමසාරිස් කාර්යාලය මගින් සම්පත් දායකයෙකු හඳුනාගනු ලැබූ අතර ශ්‍රී ලාංකීය සමාගම් 14ක් සහභාගි විය.
- ✓ ජාත්‍යන්තර වෙළඳාම, අපනයන ක්‍රියාවලිය ආදිය පිළිබඳව අපනයනකරුවන්ගේ හා අපනයන විභව්‍ය ව්‍යාවසායන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ 30ක් පැවැත්වූ අතර මේ සඳහා 60,000ක් පමණ පිරිසක් සහභාගි විය.
- ✓ වයඹ විශ්ව විද්‍යාලයේ සිසුන් 40 දෙනෙකු සඳහා එක් කෙටිකාලීන පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය.
- ✓ ස්වස්ථ අංශයේ ජාතික/ ජාත්‍යන්තර විවිධ ඉලක්කගත පාර්ශවකරුවන් සමග "ශ්‍රී ලංකා ස්වස්ථ සභිය" පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණ මාලාවක් පවත්වනු ලැබීය. ‘‘ආනයනයන් තාවකාලිකව තහනම් කිරීම පිළිබඳ නියෝග’’ අවබෝධකර ගැනීම - 2020 ජූනි 19.
- ✓ ශ්‍රී ලාංකීය විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අංශය සඳහා ගැලපීම කිරීමේ හා වෙළඳපල ප්‍රවේශ අවස්ථාවන් - 2020 ජූලි 15.
- ✓ බ්‍රසීලයේ වෙළඳපල අවස්ථා හා සාර්ථක වෙළඳපල ප්‍රවේශ සඳහා උපායමාර්ග - 2020 සැප්තැම්බර් 15.
- ✓ ශ්‍රී ලංකා - පකිස්ථානු වෙළඳ හා ආයෝජන අවස්ථා - 2020 සැප්තැම්බර් 18.
- ✓ පෝලන්තය, රුසියාව තුර්කිය යන රටවල ශ්‍රී ලාංකීය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම - 2020 සැප්තැම්බර් 15.
- ✓ අප්‍රිකානු කලාපය හා තුර්කිය සඳහා බෝට්ටු නිෂ්පාදන අංශයේ මාර්ගගත සමුළු දෙකක් - 2020 ජූලි 6 හා 7වන දිනයන්හි.
- ✓ අපනයනකරුවන්/ විභව්‍යතාවයක් ඇති අපනයනකරුවන් සඳහා සභිපතා දැනුවත් කිරීමේ මාර්ගගත සමුළු මාලාව - මාර්ගගත සමුළු18ක් පවත්වනු ලැබීය.
- ✓ සැපයුම් අංශයේ අවස්ථාවන් පිළිබඳව විදේශ දූත කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා මාර්ගගත සමුළුවක් පවත්වනු ලැබීය.
- ✓ සමුද්‍ර ඉංජිනේරු අංශයේ අවස්ථාවන් පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත සමුළුවක් පවත්වනු ලැබීය.
- ✓ COVID 19 වසංගත තත්වය සලකා ජාත්‍යන්තර වෙළඳපලෙහි ඇති අපනයන අවස්ථා ග්‍රහණය කර ගැනීම සඳහා ශ්‍රී ලාංකීය අපනයන සමාගම් සම්බන්ධ කිරීම පිණිස ශ්‍රී ලංකීය දූත කණ්ඩායම් සමග කටයුතු කරනු ලැබීය.

6. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SME) සංවර්ධනය

6.1. නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන - නව අපනයනකරුවන් ලෙස සංවර්ධනය කළ හැකි විභව්‍ය ව්‍යවසායකයින් හඳුනා ගැනීම.

- තෝරාගත් මල්වගාකරුවන් හා අපනයන සමාගම් සමග වගාකිරීමේ ක්‍රියාවලිය පිළිබඳව පෙන්වාදීම සඳහා 2020 ජනවාරි 14 වන දින පවත්වනු ලැබූ වැඩමුළුව සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ 33 දෙනෙකු සහභාගි විය.
- කාබනික සහතිකකරණය ලබාගැනීම සඳහා ගොවි කණ්ඩායම් 06කට පහසුකම් සලසනු ලැබීය.
- 2020 ප්‍රංශයේ Apparal Sourcing Paris ප්‍රදර්ශනයේ දී මාර්ගගත වේදිකාවේදී සිය නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා සමාගම් 06කට පහසුකම් සලසනු ලැබීය.
- පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශන 12 වන වරට මෙවරද 2020 පෙබරවාරි 07 සිට 09 වන දින දක්වා BMICH හිදී පැවති අතර 25,000 පමණ පිරිසක් මෙය නැරඹීමට පැමිණියහ. ප්‍රදර්ශන කුටි 225කදී දේශීය ප්‍රදර්ශනකරුවන් 101 හා විදේශීය ප්‍රදර්ශනකරුවන් 27 දෙනෙකු තම නිෂ්පාදන ප්‍රදර්ශනය කරනු ලැබීය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SME) සඳහා සංවිධානය කරනු ලැබූ අපනයන සංවර්ධන මණ්ඩලීය ප්‍රදර්ශන කුටියේදී SME 10 දෙනෙකු තම නිෂ්පාදන ප්‍රදර්ශනය කරනු ලැබීය.
- අපනයන වෙළඳපල පිළිබඳව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දැනුවත් කිරීම සඳහා ජූලි මාසයේදී අපනයන සංවර්ධන මණ්ඩලීය 5වන මහලේ සම්මන්ත්‍රණ ශාලාවේදී EFFEXPO උපදේශකයින් සමගින් වැඩමුළුවක් සංවිධානය කරනු ලැබීය.
- Sri Lanka Go Digital පිලිබඳ දින 4ක මාර්ගගත සමුළුවක් සංවිධානය කරනු ලැබීය - ICTA උපදේශකත්වය යටතේ 2020 අගෝස්තු 21, 27 හා 28 යන දිනයන් හිදී accelerating sales with Facebook යන විස්තීර්ණ වැඩමුළුව පැවැත්විණ.
- 2020 පෙබරවාරි 18වන දින අපනයන සංවර්ධන මණ්ඩලයේ දකුණු පළාත් කාර්යාලයේදී "අපනයන වෙළඳපල සඳහා මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදන වැඩිදියුනු කිරීම" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව පැවැත්විණි. මේ සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 16 දෙනෙක් සහ සංවර්ධන නිලධාරීන් 04 දෙනෙක් සහභාගි විය.
- 2020 පෙබරවාරි 17වන දින අපනයන සංවර්ධන මණ්ඩලයේ දකුණු පළාත් කාර්යාලයේදී පැවති අපනයන අවස්ථා, වෙළඳපල ප්‍රවනතා හා නව අපනයනකරුවන් සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යවසායන් සඳහා අපනයන වැඩපිළිවෙල පිළිබඳ වැඩමුළුව සඳහා 24 දෙනෙක් සහභාගි විය.

- කෝපි සංවිධානයේ සාමාජිකයින් 18 දෙනෙකු සමග නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්ෂුද්‍ර අපනයන භෝග යටතේ කෝපි සඳහා අපනයන සංවර්ධනය පිළිබඳ රැස්වීමක් 2020.12.13 දින පවත්වනු ලැබීය.
- යහපත් කෘෂිකාර්මික ක්‍රියාපිළිවෙත්/ ගෝලීය පරතරය යන වැඩමුළුව 2020 මාර්තු 13 වන දින මහනුවරදී පවත්වනු ලැබීය. සේ සඳහා නිලධාරීන් 07දෙනෙක් හා ව්‍යවසායන් 23 දෙනෙක් සහභාගි විය.
- M/s. Aroma Natural Rubber Pvt Ltd සඳහා 2020 පෙබරවාරි 23 -25 දින දක්වා ඊජිප්තුවේ කයිරෝ නුවරදී ගැනුම්කරු විකුණුම්කරු හමුවක් සංවිධානය කරනු ලැබීය.
- SLS 1324-2018 අනුකූලව වගාකරු/ සැකසුම්කරුවන් සඳහා කාබනික සහතික ලබාගැනීම සඳහා උතුරු පළාතේ ගොවීන් 8 දෙනෙකු සඳහා පහසුකම් සලසනු ලැබීය.
- උතුරු පළාතේ සකස් කළ ආහාර, කුළුබඩු හා සාන්ද්‍ර ද්‍රව්‍ය නිෂ්පාදකයින් 20 දෙනෙකුගේ සහභාගිත්වයෙන් B2B ව්‍යාපාරික හමුවක් සංවිධානය කරනු ලැබූ අතර යාපනයේ අපනයන සමාගමක් වන Miracle Tree (Pvt) Ltd සමග සම්බන්ධකරනු ලැබීය.
- යාපනයේ ආහාර, කුළුබඩු හා සාන්ද්‍ර ද්‍රව්‍ය සහ අත්කම් නිෂ්පාදකයින් සඳහා 2020.09.08 දින සංවිධානය කරනු ලැබූ B2B ව්‍යාපාරික හමුවේදී අපනයන සමාගමක් වන Iron Bird International Pvt Ltd සමග සම්බන්ධ කරනු ලැබීය.
- 2020 නොවැම්බර් 27 දිනය පුරාම තෝරාගත් ව්‍යවසායකයින් 72 දෙදෙනෙකු සඳහා ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ හා ජපානයේ ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලයේ (SLBCJ) සහය ඇතිව වෙළඳපල හඳුනා ගැනීම, නිෂ්පාදන සංවර්ධනය සහ ජපානය සඳහා ශ්‍රී ලංකාවේ තෑගි භාණ්ඩ හා අත්කම් භාණ්ඩ ප්‍රවර්ධනය පිළිබඳ දැනුම හුවමාරු කිරීමේ මාර්ගගත සාකච්ඡාවක් පවත්වනු ලැබීය.
- ගොවීන්/ ආහාර සැකසුම්කරුවන් 25 දෙනෙකු සඳහා SLS 1324:2018 අනුකූලව කාබනික සහතික ලබාගැනීමේ සහය වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබීය.

6.2. දැනුවත්කිරීමේ වැඩසටහන්

- 2020 ජනවාරි 20වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ පැවති ආනයන/ අපනයන ක්‍රියාවලිය, අපනයන අවස්ථාවන් පිළිබඳ වැඩමුළුව.
- 2020 ජනවාරි 28වන දින 30 දෙනෙකු සඳහා නුවරඑළියේ පැවති අපනයන ක්‍රියාවලිය හා විභව්‍ය අපනයන වෙළඳපල පිලිබඳ වැඩමුළුව.
- 2020 පෙබරවාරි 11වන දින මාතරදී පැවති තාක්ෂණික නොවන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික හැකියාව සහිත ව්‍යවසායකත්ව පිළිබඳ වැඩමුළුව.
- 2020 පෙබරවාරි 13වන දින පන්විල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පැවති අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යයන් පිළිබඳ වැඩමුළුව.

- 2020 ජූලි 8 සහ 9වන දින CISMEF මාර්ගගත ප්‍රදර්ශනය පිළිබඳ සංක්ෂිප්ත සාකච්ඡාව.
- 2020 අගෝස්තු 28වන දින කොළඹ පැවති අපනයනයට සූදානම් SME සඳහා ලබාගත හැකි මූල්‍යමය පහසුකම් පිලිබඳ වැඩමුළුව.
- 2020 සැප්තැම්බර් 10වන දින වවුනියා නගර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පැවති උඳු ගොවීන් සඳහා වෙළඳපල සකස් කිරීමේ වැඩසටහන.
- 2020 සැප්තැම්බර් 10 දින නුවරඑළියේදී ගරු අමාත්‍යවරයා සමග පැවති රැස්වීම.
- 2020.01.28 දින නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරන ලද අපනයන ක්‍රියාවලිය හා විභව්‍ය ව්‍යවසායකයින් සඳහා විභව්‍ය අපනයන වෙළඳපල යන වැඩසටහන පවත්වනු ලැබූ අතර මේ සඳහා 30 දෙනෙකු සහභාගි විය.
- අපනයන සංවර්ධන නිලධාරි විසින් හඳුනාගනු ලැබූ විභව්‍ය ව්‍යවසායකයින් 56 දෙනෙකු සඳහා ශ්‍රී ලංකාවේ වත්මන් අපනයන ක්‍රියාවලිය පිළිබඳ වැඩසටහන 2020 අගෝස්තු 28 වන දින බදුල්ලේදි පවත්වනු ලැබීය.
- 2020 ජූලි 08 වන දින 37 දෙනෙකුගේ සහභාගිත්වය හා Control Union Inspection Pvt Ltd ආයතනයේ සහය ඇතිව 2020 ජූලි 08වන දින කාබනික ජාත්‍යන්තර ප්‍රමිති සහතිකකරණ වැඩසටහන සංවිධානය කරනු ලැබීය.
- ජර්මානු කාර්මික හා වාණිජ මණ්ඩලය සමග යාපනයේ පාරිභෝගික ද්‍රව්‍ය අපනයන වෙළඳපල පිලිබඳ 2020 ජූලි 28 වන දින පැවති රැස්වීම සඳහා 34 දෙනෙකු සහභාගි විය.

6.3. වැඩමුළු

- 2020 පෙබරවාරි 18වන දින දකුණු පළාත් කාර්යාලයේදි 16 දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව "අපනයන වෙළඳපල සඳහා මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදන වැඩිදියුණු කිරීම" පිළිබඳ වැඩමුළුව පැවැත්විණ.
- විභව්‍ය ආහාර අපනයනකරුවන් සඳහා 2020 ජනවාරි 30 වන දින කළුතර දිස්ත්‍රික්කයේ පැවති අපනයන සඳහා ව්‍යාපාර ක්‍රමවත්කිරීම, මූලික අපනයන ක්‍රියාවලිය සහ ඇසුරුම්කරණය හා ලේබල්කරණය පිළිබඳ වැඩමුළුව.
- 2020 ජනවාරි 23 හා 24 යන දිනයන් හිදී මධ්‍යම පළාතේ සමාගම් 11ක් සඳහා පැවති HACCP /ISO 22000 පිළිබඳ වැඩමුළුව.
- 2020 මැයි 13 වන දින යාපනයේ දී උතුරු පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 45 දෙනෙකු සඳහා පැවැත්වූ ව්‍යාපාර සඳහා තාක්ෂණය වැඩමුළුව.
- 2020 සැප්තැම්බර් 29 වන දින අපනයන සංවර්ධන නිලධාරින් (EDO) 48 දෙනෙකු සඳහා ජාත්‍යන්තර වෙලඳපලෙහි අපනයන අවස්ථා මෙන්ම වෙනත් අදාල මෘදු කුසලතා සම්බන්ධයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් (ToT) පවත්වනු ලැබීය.

6.4. කාන්තා සංවර්ධන වැඩසටහන

- 2020 මාර්තු 6 වන දින අපනයන සංවර්ධන මණ්ඩලයේ දී කාන්තා ව්‍යවසායකයින් 20 දෙනෙකු සඳහා නිෂ්පාදන ප්‍රවර්ධනය පිළිබඳ එක් දින දැනුම හුවමාරු වැඩමුළුවක් පවත්වනු ලැබීය.
- 2020 මාර්තු 10 වන දින අපනයන සංවර්ධන මණ්ඩලයේ දී කාන්තා ව්‍යවසායකයින් 10 දෙනෙකු සඳහා අපනයන වෙලඳපල වැඩසටහනක් (නිෂ්පාදන ප්‍රවර්ධන) පැවැත්වූ අතර විනිශ්චය මණ්ඩලය විසින් තෝරාගත් එකු අයෙකුට රු.200,000/- බැගින් ජයග්‍රාහිකාවන් 3 දෙනෙකු සඳහා රු.600,000/- ක් ප්‍රදානය කරනු ලැබීය.
- කාන්තාවන් 12 දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව 2020 ජූනි 11වන දින පැවැත්වූ සකස් කළ තල් ආශ්‍රිත නව නිෂ්පාදන (තල් පිටි ආශ්‍රිත බිස්කට්, නට් බාර් හා තල් කේක්) සංවර්ධනය කිරීමේ වැඩසටහන.
- කාන්තාවන් 11දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව 2020 අගෝස්තු 13වන දින පැවැත්වූ සකස් කළ තල් ආශ්‍රිත නව නිෂ්පාදන (තල් පෝෂ, කල් සුප් මිශ්‍රණය හා තල් කුකීස්) සංවර්ධනය කිරීමේ වැඩසටහන.
- 2020 දෙසැම්බර් 1, 3, 8 හා 10 යන දිනයන් හිදී ICTA ආයතනය සමගින් කාන්තා ව්‍යවසායකයින් 75 දෙනෙකු සඳහා ඩිජිටල් අලෙවිකරණය මගින් අලෙවිය වේගවත් කිරීම යන දින 4ක මාර්ගගත වැඩමුළුව සංවිධානය කරනු ලැබිය.
- මුල්ලයි කාන්තා සමිතිය (මුලතිවු), සස්ටේනින් හැන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් (යාපනය) හා කනිස්තියා තල් නිෂ්පාදන (මුලතිවු) යන කුඩා හා මධ්‍ය පරිමාණ කාන්තා ව්‍යවසායන් 03 සඳහා 2020 යාපන ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සහභාගිවීම සඳහා පහසුකම් සලසනු ලැබීය.
- නිෂ්පාදන මිලදී ගැනීමේ අරමුණින් SAP Kultura සමාගම මගින් මධ්‍යම පළාතේ අත්කම් කර්මාන්තයේ නියලි කාන්තාවන් 24 දෙනෙකු සඳහා 2021.08.15 දින පැවැත්වූ සැපයුම් සංවර්ධන වැඩසටහන.
- කාන්තා ව්‍යවසායකයින් 25 දෙනෙකු සඳහා 2020 මාර්තු 11 සිට 13 දින දක්වා එක්සත් රාජධානියේ පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය මගින් ගලදාරි හෝටලයේ පවත්වනු ලැබූ ඩිජිටල් බූත් කඳවුර.
- 2020 පෙබරවාරි 28 - 29 යන දිනයන්හි යටිනුවර ප්‍රාදේශීය කොට්ඨාශයේ පැවැත්වූ අගය එකතුකරන ලද අත්යන්ත්‍ර නිෂ්පාදන සඳහා නිර්මාණ/නිෂ්පාදන සංවර්ධන වැඩසටහන සඳහා 30 දෙනෙකු සහභාගිවිය.

6.5. එක් ගමක් එක් නිෂ්පාදනයක් (OVOP) වැඩසටහන

- අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දිවයින පුරා OVOPs 48ක් ස්ථාපනය කරනු ලැබ ඇති අතර මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රාදේශීය වශයෙන් ගොවීන්/ නිෂ්පාදනයින් 4,559 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත.
- 2020 ජනවාරි 03 වන දින OVOP වැඩසටහන යටතේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දඹදෙණිය EPV පැවැත්වූ අපනයන වෙළඳපල සඳහා කෝමාරිකා සඳහා වෙළඳපල සම්බන්ධ කිරීම හා සැපයුම් පදනම වැඩිදියුණු කිරීම පිළිබඳ වැඩමුළුව.
- 2020 පෙබරවාරි 18 වන දින පළතුරු වගා කරන්නන් 30 දෙනෙකු සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැවැත්වූ වෙළඳපල සම්බන්ධ කිරීම පිළිබඳ වැඩමුළුව
- 2020 පෙබරවාරි 24 වන දින 30 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්වූ සැපයුම් ජාල සංවර්ධන (සේර, ඉඟුරු හා ගර්කින්) වැඩසටහන.
- සේර වගාකරුවන් සඳහා සැපයුම වැඩිදියුණු කිරීම හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීම 2020 පෙබරවාරි 26 දින මහනුවර දිස්ත්‍රික්කයේදි පැවැත්විණ.
- 2020 ජූනි 18 හා 24 යන දිනවල නුවරඑළිය දිස්ත්‍රික්කයේ වගාකරුවන් 148 දෙනෙකු සඳහා Natural Vanilla (pvt) Ltd සමඟ ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන් 02ක්.
- ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සහයෝගීතාවය ඇතිව අගය එකතුකරන ලද අත්යන්ත්‍ර නිෂ්පාදන සඳහා නිර්මාණ/නිෂ්පාදන සංවර්ධන වැඩසටහන 2020 පෙබරවාරි 28 හා 29 දිනවල පැවැත්විණ.
- M/s HDDES Group ආයතනයේ නියෝජිතයින් සමඟ 2020 ජූනි 6 වන දින කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේදි පවත්වන ලද සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරමේ වැඩසටහන සඳහා සහභාගිවූ 10 දෙනෙකු ප්‍රතිලාභ ලැබීය.
- M/s Woga Natural (Pvt) Ltd ආයතනයේ නියෝජිතයින් සමඟ 2020 ජූනි 6 වන දින කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේදි පවත්වන ලද කොස් සඳහා සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන සඳහා සහභාගිවූ 40 දෙනෙකු ප්‍රතිලාභ ලැබීය.
- M/s Consolidated Business Systems Ltd ආයතනයේ නියෝජිතයින් සමඟ 2020 ජූලි මාසයේදී කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේදි පවත්වන ලද මඤ්ඤොක්කා සඳහා මූලික සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන සඳහා සහභාගි වූ දෙදෙනෙකු ප්‍රතිලාභ ලැබීය.
- M/s HDDES Group Ltd ආයතනයේ නියෝජිතයින් සමඟ 2020 ජූලි මාසයේදී කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේදි පවත්වන ලද කාබනික

කතුරුමුරුංගා සඳහා මූලික සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන සඳහා සහභාගි වූ 7දෙනෙකු ප්‍රතිලාභ ලැබීය.

- කෝමාරිකා සඳහා සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන 2020 පෙබරවාරි 11 වන දින යාපනය දිස්ත්‍රික්කයේ තිලිප්පලෙයි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දී 51 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.
- උඳු වගාකරුවන් සඳහා සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන 2020 සැප්තැම්බර් 19 වන දින වවුනියා නගර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේදී පවත්වනු ලැබීය.
- කුඩුබඩු අංශය යටතේ කරදමුංගු සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන 2020 ජනවාරි 29 වන දින බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේදී පවත්වනු ලැබීය. මේ සඳහා 50 දෙනෙකු සහභාගි විය.
- M/s Kanthala (pvt) Ltd සමාගම සමඟ හණ කෙඳි සඳහා සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන 2020 පෙබරවාරි 24 වන දින හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි පවත්වනු ලැබීය.
- මල් හා විසිතුරු ශාක වගාකරුවන් සඳහා 2020 පෙබරවාරි 10 වන දින පේරාදෙණිය උද්භීද උද්‍යාන දෙපාර්තමේන්තුවේ දී කැපූ මල් හා විසිතුරු ශාක වගාකිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට පහසුකම් සලසනු ලැබූ අතර මේ සඳහා 20 දෙනෙකු සහභාගි විය.
- M/S Kiyota Coffee Company සහයෝගිතාවය ඇතිව කෝපි ව්‍යාපෘතිය පිළිබඳ සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහනක් 2020 ජූලි 24 වන දින නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දී පැවැත්විණ. අපනයන සමාගම විසින් වගාකරුවන් අතර නොමිලේ පැල 3000ක් බෙදාදෙනු ලැබීය.
- 2020 ජූනි 22 වන දින හස්ත කර්මාන්ත/ තැගි භාණ්ඩ හා එදිනෙදා ජීවිතයට අවශ්‍ය භාණ්ඩ සඳහා පැවැත්වූ ගැනුම්කරු විකුණුම්කරු රැස්වීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 11 දෙනෙකු සහභාගි වූහ.
- පැෂන් පෘට් පිළිබඳ සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහනක් 2020 ජූලි 25 වන දින දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේදී පැවැත්විණ. M/s Ran Crip Marketing (Pvt) Ltd සමාගම විසින් වගාකරුවන් 11 දෙනෙකු අතර නොමිලේ පැල 2000ක් බෙදාදෙනු ලැබීය.
- පොල් සංවර්ධන අධිකාරියේ සහයෝගිතාවය ඇතිව 2020 අගෝස්තු 20, 21 හා 22 වන දිනයන්හිදී දින 03ක පොල්කටු හස්ත කර්මාන්ත පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය.
- M/s Sri Lanka Natural Spices & Herbal product (Pvt) Ltd සමාගම සමඟ අපනයන වෙළඳපල සඳහා රෝස යන සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ

වැඩසටහන 2020 අගෝස්තු 27 වන දින යටියන්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි පවත්වනු ලැබීය. මේ සඳහා 56 දෙනෙක් සහභාගි විය.

- අපනයන වෙළඳපල සඳහා රෝස සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන 2020 සැප්තැම්බර් 22 වන දින මහනුවර දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි පවත්වනු ලැබීය. මේ සඳහා 132 දෙනෙක් සහභාගි විය.
- M/s Sri Lanka Natural Spices & Herbal product (Pvt) Ltd සමාගම සමඟ අපනයන වෙළඳපල සඳහා රෝස සැපයුම් සංවර්ධන හා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ වැඩසටහන 2020 සැප්තැම්බර් 25 වන දින මාතලේ දිස්ත්‍රික්කයේදී පවත්වනු ලැබීය. මේ සඳහා 90 දෙනෙක් සහභාගි විය.
- ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ (NDC) සහයෝගීතාවය ඇතිව පොල් කටු හස්ත කර්මාන්තය සඳහා නිෂ්පාදන/ මෝස්තර සංවර්ධන වැඩසටහන් 2ක් 2020 ජූනි 25 හා 26 දිනවල පන්නිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වනු ලැබීය. මේ සඳහා 35 දෙනෙක් සහභාගි විය.

<u>දේශිය වෙළඳ ප්‍රදර්ශන</u>

- 2020 ජනවාරි 24 - 26 වන දින දක්වා යාපනයේ පැවති 11 වන යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයේදි (JITF) තොරතුරු කවුළුව සමග EDB-SME ප්‍රදර්ශන කුටිය සංවිධානය කරනු ලැබූ අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 08 දෙනෙක් සහභාගි විය.

7. අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

7.1. වෙළඳපල ප්‍රවේශ සහය වැඩසටහන 2018-2021

- I කාණ්ඩයේ හා II කාණ්ඩය මගින් මේ දක්වා ලැබී ඇති මුළු අයදුම්පත් සංඛ්‍යාව 309ක් වේ.
- අදාල ඇගයුම් කමිටුව මගින් රු. මිලි. 336.52ක් වන ප්‍රදානයන් ලබාදීම සඳහා කාණ්ඩ දෙකෙන්ම අයදුම්පත් 118ක් අනුමත කරනු ලැබීය.

විස්තරය	අනුමත ව්‍යාපෘති		වැයවූ අරමුදල්		අත්හිටවූ / ඉවත් කරගනු ලැබූ ව්‍යාපෘති	වැය කළ යුතු අරමුදල්	
	සංඛ්‍යාව	වටිනාකම (රු.මිලි)	සංඛ්‍යාව	ප්‍රමාණය (රු.මිලි.)		සංඛ්‍යාව	ප්‍රමාණය (රු.මිලි.)
I කාණ්ඩය	42	23.078	40	22.940	01	1	0.138
II කාණ්ඩය - 40%	76	313.443	54	90.650	03	19	34.728
II කාණ්ඩය - 50%			11	21.076		62	129.933
T II කාණ්ඩය - 10%			0	-		73	30.202
එකතුව	**118**	**336.52**		**134.666**			**195.001**

7.2. ‘‘තොරතුරු තාක්ෂණ ආරම්භයන්’’ ස්ථාපනය කිරීම (IT Initiative)

- නිම කිරීමෙන් අනතුරුව ප්‍රධාන සමාගම් 14ක් 100%ක ප්‍රදානයන් සඳහා සහය විය.
- සිංගප්පූරුවේ ඩිජිටල් අලෙවිකරණ වැඩසටහනේදී ව්‍යාපාරික සබඳතා 6ක් ඇතිකර ගනු ලැබීය.
- සමාජ මාධය ජාල 5ක් හරහා මාර්ගගත වෙළඳ දැන්වීම් 28ක් පළකරනු ලැබූ අතර IOI වෙබ් අඩවියේ සිද්ධි අධ්‍යයන 4ක් පළකර අන්තර්ගතය යාවත්කාලීන කරනු ලැබීය.
- ප්‍රාදේශිය ‘‘තොරතුරු තාක්ෂණ සති’’ වැඩසටහන් 2ක් (මාතර - 2018/ බදුල්ල - 2019) හා 2020 මැයි මාසයේදී එක් ඩිජිටල් ‘‘තොරතුරු තාක්ෂණ සති’’ වැඩසටහනක් පවත්වනු ලැබීය.
- 2018 දී එක් නිපුණතා දින ඉසව්වක්.
- AI වටමේස සාකච්ඡා.
- විශ්ව විද්‍යාල පාඨමාලා තුනක්.
- IOI සන්නාමය සඳහා අලෙවිකරණ තොරතුරු ඇතුළත් වීඩියෝ 4 (AVs).
- රටින් පිටත දූත මෙහෙයන් (මැද පෙරදිග හා ඕස්ට්‍රේලියාවේ).

7.3. පෞද්ගලික අංශය මගින් ටයර් පරීක්ෂා කිරීමේ හා වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ පහසුකම් ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සැලසීම

ටයර් පරීක්ෂා කිරීමේ හා වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ පහසුකම් ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා රබර් පර්යේෂණ ආයතනයේ උසස් තාක්ෂණික යන්ත්‍ර 02ක් ස්ථාපනය කරනු ලැබිය. මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මත කිරීම පිළිබඳ පාර්ශව අතර රැස්වීමක් පවත්වනු ලැබීය.

7.4. බෝට්ටු නිෂ්පාදනය සඳහා යටිතල පහසුකම් හා නියාමන රාමුවක් වැඩිදියුණු කිරීම

- **නියාමන රාමුවක් වැඩිදියුණු කිරීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර M/s Lloyd’s Register Asia ආයතනයේ සේවාව ලබාගනිමින් නියාමන රාමුව (ධීවර බෝට්ටු හැර) සකස් කර ඇත. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නිර්දේශිත ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන සඳහා දැනටමත් නියාමන රාමුව ඉදිරිපත්කර ඇත. උදා: නියාමන රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස වෙළඳ නාවුක ලේකම් කාර්යාලය, වරාය හා නාවුක කටයුතු අමාත්‍යාංශය සහ වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් කර්මාන්ත අමාත්‍යාංශයට ඉල්ලීම් කර ඇත.

- **යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම – කප්පරතොට දියකඩනයක් ඉදිකිරීම**

සේවා සැපයුම්කරු වන M/s Lanka Hydraulic Institute Ltd (LHI) විසින් පාරිසරික වාර්තාව හැර පූර්ව ශක්‍යතාවය, ආරම්භය, මධ්‍ය කාලීන හා අවසන් ශක්‍යතාවය, විස්තරාත්මක සැලසුම්, විස්තරාත්මක සැලසුම් සටහන්, පිරිවිතර, ඉන්ජිනේරු ඇස්තමේන්තු මෙන්ම ලංසු ලේඛණ අපනයන සංවර්ධන මණ්ඩලයට ඉදිරිපත්කර ඇත.

වෙරළ සංරක්ෂණ සහ වරාය සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CCD) විසින් නිකුත් කර ඇති නිර්ණය විෂයයන්ට (TOR) අනුකූලව පාරිසරික බලපෑම ඇගයීම (EIA) සිදුකළ යුතුය. CCD විසින් ව්‍යාපෘතියේ විස්තරාත්මක සැලසුම් සිදුකිරීමට භාරගෙන ඇති නියෝජිතායතනය මගින් පාරිසරික බලපෑම ඇගයීම (EIA) සිදු නොකළ යුතු බවට කොන්දේසියක් සහිතව නිර්ණය විෂයයන් නිකුත් කරනු ලැබීය.

නව උපදේශන ප්‍රසම්පාදන කමිටුව (CPCD) පත්කර ඇති අතර පාරිසරික බලපෑම ඇගයීම (EIA) සිදුකිරීම සඳහා එක් එක් උපදේශන සමාගම් වලින් යෝජනා සඳහා ඉල්ලීම් කිරීමට අදාල ලේඛණ පිළියෙල කිරීම අවසන් කර ඇත. 2021 ජනවාරි 22 වන දින වෙළඳ දැන්වීම පළ කරනු ලැබූ අතර යෝජනා 13ක් ලැබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින්, යෝජනා අගයුම්කර EIA සිදුකිරීමට සුදුසු උපදේශන සමාගමක් පත්කිරීමට උපදේශන ප්‍රසම්පාදන කමිටුව (CPCD) කටයුතු කරමින් සිටී.

8. 2021 වසර සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ අනාගත සැලසුම්.

අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) ආරම්භක කාර්යයන් මූලික වශයෙන් රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවේ මූලික ප්‍රතිපත්ති තුනක් වන මිත්‍රශීලි හා නොබැඳි විදේශ ප්‍රතිපත්තිය, තාත්ෂණය පාදක සමාජය, ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනය හා අනුකූල වේ. මීට අමතරව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය මෙන්ම අගය එකතු කිරීම පිළිබඳව ද මණ්ඩලය අවධානය යොමු කෙරෙන අතර මේ සම්බන්ධ ක්‍රියාකාරකම් ගණනාවන් සිදුකිරීමට නියමිතයි.

වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන යන අංශ දෙකම සඳහා 2021 වසරේදී ඇ.ඩො.බිලි.15.7ක ඉලක්කයක් ලබාදී ඇති අතර වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ඇ.ඩො.බිලි. 12.1ක හා සේවා අපනයනයෙන් ඇ.ඩො.බිලි. 3.6ක ආදායමක් අපේක්ෂා කෙරේ.

තවද වත්මන් ගෝලීය තත්වය සලකා 2021 ක්‍රියාකාරී සැලැස්ම EDB විසින් සම්පාදිත නව සංශෝධිත උපායමාර්ගික සැලසුමට අනුකූලවේ.

සැලසුමේ මූලික උපායමාර්ගික අරමුණු වන්නේ;

- දැනට සිටින අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයනයන් රැකගැනීමට සහයවීම.
- වත්මන් ශ්‍රී ලංකා අපනයනයන් වෙනස් කිරීම සඳහා නව අපනයනයන ප්‍රවර්ධනය කිරීම.
- නව වෙළඳපල සඳහා විවිධාංගිකරණය කිරීම
- හැකියා වර්ධනය වැඩිදියුණු කිරීම.
- රට තුලට අපනයන පාදක විදේශ ආයෝජන උත්පාදනය කිරීම

EDB උපදේශක කමිටු හා අංශික සංගම් සමග සාකච්ඡා කර වසංගතය හේතුවෙන් දැනට පවතින කර්මාන්ත ආරක්ෂා කරන අතරම නව අපනයන මාර්ග ගවේෂණය කරමින් 2021 තුල අපනයනයන් අඛණ්ඩව පවත්වා ගැනීම කෙරෙහි යොමුවී ක්‍රියාකාරි සැලැස්ම සකස්කර ඇත.

අපනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම - ශ්‍රී ලාංකීය නිෂ්පාදන හා සේවාවන් සඳහා ගෝලීය වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු කිරීම

- තෝරාගත් ප්‍රමුඛ හා නැගීඑන වෙළඳපලහි ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන/ ඉසවු සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීම.
- තෝරාගත් වෙළඳපල කරා රට තුලට හා රටින් පිටතට වෙළඳ දූත කණ්ඩායම් සංවිධානය කිරීම.
- වෙළෙඳපළ බුද්ධිමය තොරතුරු (Market Intelligence).
- ජාතික අපනයන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
- අපනයන සැපයුම් පදනම වැඩිදියුණු කිරීම.
- නව අපනයනකරුවන් සංවර්ධනය කිරීම.
- කාන්තා ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම.
- එක් ගමක් - එක් නිෂ්පාදනයක් වැඩසටහන (OVOP).
- ශ්‍රී ලංකාව සන්නාමකරණය හා ශ්‍රී ලාංකීය නිෂ්පාදන ගෝලීය වශයෙන් ස්ථානගත කිරීම.
- ‘‘ලංකා කුරුඳු’’ සන්නාමය වැඩිදියුනු කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.
- ලංකා කුරුඳු සඳහා භූගෝලිය දර්ශක.
- ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකාර්මික අගයදාමයන් හි ප්‍රතිරූපය හා විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම.
- ‘‘අපනයන වෙළඳපල ප්‍රවේශ සහය’’ වැඩසටහන අඛණ්ඩව සිදුකිරීම.
- වෙළඳපල ප්‍රවර්ධන සහය යෝජනා ක්‍රමය (Market Access Support).
- නව උපදේශණ කමිටු ඇති කිරීම.
- කර්මාන්තයන්ට විශේෂිත ගැටළු සඳහා විසඳුම් ලබාදීම.

- අපනයනකරුවන් මුහුණදෙන ගැටළු විසඳීම [අපනයනකරුවන්ගේ සංසදය].
- ජනාධිපති අපනයන සම්මාන පිරිනැමීම මගින් අපනයනකරුවන්ට පිළිගැනීමක් ලබා දීම.
- වෙළඳ සංඛ්‍යාලේඛණ හා ගැනුම්කරුවන් පිළිබඳ තොරතුරු සැපයීම.
- ප්‍රකාශන - Business Lanka සඟරාව, ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ නාමාවලිය 2020.
- වෙළඳ තොරතුරු, වෙළඳපල ඥානය, විද්‍යුත් විද්‍යුත් වාණිජ සේවාවන් අපනයන හා සම්බන්ධ ප්‍රකාශන ලබාදීම.
- ප්‍රවර්ධනාත්මක පත්‍රිකා.
- ආනයන/අපනයන ක්‍රමවේද, ජාත්‍යන්තර වෙළඳාම හා අපනයන ඇසුරුම්කරණය පිළිබඳ සහතිකකරණ පාඨමාලා.
- ඉලෙක්ට්‍රොනික පුස්තකාලය.
- EDB ආයතනික විඩියෝව 2020.
- මාර්ගගත වෙළඳ තලය - වෙබ් අඩවිය.
- EDB ඩෙබ් අඩවිය ඔස්සේ ශ්‍රී ලංකිය නිෂ්පාදන මාර්ගගතව ප්‍රවර්ධනය කිරීම.
- අපනයනය හා අදාල විෂයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, නිපුණතා සංවර්ධන හා ව්‍යවසායනත්ව වැඩසටහන් පැවැත්වීම.
- කාබනික කෘෂිකාර්මික අංශය පිළිබඳ වාර්තාමය වීඩියෝ පටය සකස් කිරීම.
- SLS 1324:2018 අනුකූලව කාබනික සහතිකකරණය හරහා අපනයන ඉලක්ක කරගත් සැපයුම් ජාල වැඩිදියුණු කිරීම.

මූල්‍ය ප්‍රකාශන 2020

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2020.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2020 රු. ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
ශුද්ධ දේපල පිරියත හා උපකරණ	(8)	29,801,280.34	34,490,100.29
සඳහන් නොකෙරුණු සමාගම් ආයෝජන	(9)	1,123,606,578.07	1,052,821,878.95
		1,153,407,858.41	1,087,311,979.24
වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්	(10)	52,865,105.90	54,800,083.23
මුළු ජංගම නොවන වත්කම්		1,206,272,964.31	1,142,112,062.47
ජංගම වත්කම්			
තොග	(11)	2,857,902.89	2,797,044.96
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	(12)	145,013,406.23	145,200,571.08
අත්තිකාරම් හා ඉදිරි ගෙවීම්	(13)	7,154,463.50	30,726,129.67
මුදල් හා මුදල් සමාන දෑ	(14)	27,734,024.24	13,010,416.74
		182,759,796.86	191,734,162.45
මුළු වත්කම්		**1,389,032,761.17**	**1,333,846,224.92**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධන හා වෙන් කිරීම්			
ආධාර ලැබීම් - ප්‍රාග්ධන දායකත්වය	(15)	10,014,284.00	10,014,284.00
වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය		1,138,693,881.32	1,064,982,748.96
මුළු හිමිකම්		1,148,708,165.32	1,074,997,032.96
ආධාර			
ආධාර ලැබීම් - වෙනත්	(16)	23,923,319.01	26,585,000.86
		23,923,319.01	26,585,000.86
ජංගම නොවන වගකීම්			
වෙන්කිරීම් හා අනිකුත් වගකීම්	(17)	22,700,376.89	57,374,396.89
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	(18)	77,267,377.50	75,445,155.25
		99,967,754.39	132,819,552.14
ජංගම වගකීම්			
අනිකුත් ගෙවිය යුතු දෑ	(19)	116,433,522.45	99,444,638.96
		116,433,522.45	99,444,638.96
මුළු හිමිකම් හා වගකීම්		**1,389,032,761.17**	**1,333,846,224.92**

පිටු අංක 164 සිට 179 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 45 සිට 54 දක්වා ඇති සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,

සුරේශ් ද මෙල්	කෞශල යහම්පත්	පී. එම්. අම්සා	ජී. එම්. හේරත්
සභාපති	**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික**	**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික**	**මුදල් අධ්‍යක්ෂිකා**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	සටහන	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2020 රු. ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත.
ආදායම්			
ආදායම්	(3)	392,934,007.11	563,709,310.35
අනෙකුත් ආදායම්	(4)	47,466,565.05	49,853,997.09
මුළු ආදායම්		440,400,572.16	613,563,307.44
වියදම්			
අපනයන සංවර්ධන වියදම්	(5)	(66,719,745.17)	(199,812,426.67)
පරිපාලන වියදම්	(6)	(370,180,134.61)	(400,254,354.14)
මෙහෙයුම් වියදම් ඉක්මවූ ආදායම්		3,500,692.38	13,496,526.63
මූල්‍ය වියදම්	(7)	(273,492.26)	(2,084,743.82)
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදම් ඉක්මවූ ආදායම්		3,227,200.12	11,411,782.81
ආශ්‍රිත සමාගමේ ලාභ/ (අලාභ) කොටස		70,784,699.12	55,333,427.19
ශුද්ධ ආදායම්		**74,011,899.24**	**66,745,210.00**
අනෙකුත් විස්තීර්ණ ආදායම්			
දේපල හා පිරියත ප්‍රත්‍යාගණනයේ ලාභ/ (අලාභ)		-	-
වර්ෂයේ අනිකුත් විස්තීර්ණ ආදායම්		-	-
වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම්		**74,011,899.24**	**66,745,210.00**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	රාජ්‍ය ආධාර	සමුච්චිත ලාභ	එකතුව
2018.12.31 දිනට ශේෂය	10,014,284.00	1,010,789,603.57	1,020,803,887.57
සාමාන්‍ය ක්‍රියා වලින් වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය	-	66,745,210.00	66,745,210.00
පෙර වර්ෂයේ ගැලපීම	-	(12,552,064.61)	(12,552,064.61)
2019.12.31 දිනට ශේෂය	**10,014,284.00**	**1,064,982,748.96**	**1,074,997,032.96**
සාමාන්‍ය ක්‍රියා වලින් වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය	-	74,011,899.24	74,011,899.24
පෙර වර්ෂයේ ගැලපීම **(22)**	-	(300,766.88)	(300,766.88))
2020.12.31 දිනට ශේෂය	**10,014,284.00**	**1,138,693,881.32**	**1,148,708,165.32**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2020.12.31 දිනෙන් අවසන් වර්ශය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2020	2019
		රු.	රු.
මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය			
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදමට වැඩි ආදායම		74,011,899	66,745,210
ගැලපීම්			
ක්ෂයවීම්		9,047,698	11,534,578
ආයෝජන වලින් ලද ආදායම		(110,711,344)	(91,734,054)
පෙර වර්ශය සඳහා ගැලපුම්		1,678,117	(4,541,281)
මූල්‍ය වියදම්		-	181,306
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද		-	(6,143,679)
රාජ්‍ය ලැබීම සඳහා ක්‍රමක්ෂය		(7,066,516)	(6,629,622)
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්		14,074,547	10,928,620
හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන		-	(51,269)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)		**(18,965,599)**	**(19,710,191)**
තොගය (වැඩිවීම)/ අඩුවීම		(60,858)	83,601
ණයගැති හා ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම		142,012	(1,995,434)
අත්තිකාරම් හා කලින් ගෙවීම් (වැඩිවීම)/ අඩුවීම		23,571,666	3,087,408
වෙන්කිරීම් හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම /(අඩුවීම)		(34,674,020)	4,986,526
වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම /(අඩුවීම)		16,988,883	(28,905,353)
මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්		**(12,997,915)**	**(42,453,442)**
මූල්‍ය වියදම් ගෙවීම්		-	(181,306)
පාරිතෝෂික ගෙවීම්		(12,252,325)	(14,481,700)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(25,250,240)**	**(57,116,448)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල්			
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්	8	(4,357,633)	(1,649,991)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලැබීම්		-	6,163,679
ලාභාංශ ලැබීම්	4	38,580,758	34,827,622
පොලී ලැබීම්	4	1,345,887	1,573,005
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**35,569,013**	**40,914,314**
මුදල් හා මුදල් සමාන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල්			
රාජ්‍ය ආධාර ලැබීම්		4,404,835	1,649,991
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**4,404,835**	**1,649,991**
වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම / (අඩුවීම)		**14,723,607**	**(14,552,143)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		13,010,417	27,562,559
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**27,734,024**	**13,010,417**
මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය			
අතැති මුදල්	15	26,764	26,671
බැංකුවේ ඇති මුදල්	15	27,707,261	12,983,746
		27,734,024	**13,010,417**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2020.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්

			එස්.එල්.එම්.ආර්.එස් 31.12.2020 රු. ශත.	එස්.එල්.එම්.ආර්.එස් 31.12.2019 රු. ශත.
(3)	**ආදායම්**			
	ලැබුනු භාණ්ඩාගාර අරමුදල්		343,909,165.40	466,850,008.33
	සංවර්ධන කටයුතු සඳහා අපනයනකරුවන්ගේ දායකය		45,404,888.00	89,261,538.65
	අන්තර්ජාල ආදායම්		302,080.58	328,426.75
	විද්‍යුත් වෙළඳ ආදායම්		692,957.76	226,569.02
	සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු		2,167,346.75	5,799,461.99
	පොත් අලෙවිය		151,905.35	312,160.00
	වෙනත් ආදායම්	3.1	305,663.27	931,145.61
			392,934,007.11	**563,709,310.35**
(3.1)	**වෙනත් ආදායම්**			
	වෙළඳපල සංවර්ධන සහකාර යෝජනා ක්‍රමය		50,000.00	-
	සිලෝන් කුරුඳු ලාංඡනය ලියාපදිංචි කිරීම		199,500.00	160,500.00
	පළාත් කාර්යාල වල වෙනත් ආදායම්		24,763.27	18,145.61
	ආපසු නොගෙවන තැන්පතු		12,000.00	77,000.00
	ණය පහසුකම් මත අයකල නීති ගාස්තු		19,400.00	25,500.00
	දැන්වීම් පුවරු ආදායම - 9 වන මහල		-	650,000.00
			305,66 3.27	**931,145.61**
(4)	**අනෙකුත් ආදායම්**			
	සේවක ණය පොළී ආදායම්		4,465,289.28	5,225,047.68
	අඩුකලා : ණයපොලී මත ගැලපීම		(3,119,402.11)	(3,652,043.14)
	ශුද්ධ සේවක ණය පොළී ආදායම්		1,345,887.17	1,573,004.54
	ලාභාංශ ආදායම		38,580,758.02	34,827,622.33
	අනෙකුත් විවිධ ආදායම්	4.1	473,403.41	6,823,748.10
	රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය		7,066,516.45	6,629,622.12
			47,466,565.05	**49,853,997.09**
(4.1)	**අනෙකුත් විවිධ ආදායම්**			
	විවිධ ලැබීම්		206,903.41	363,889.73
	ස්ථාවර වත්කම් විකිණීමේ ලාභ		-	6,143,678.90
	ආදායම් - ලියාපදිංචිය / සේවා		266,500.00	298,500.00
	විනිමය අනුපාතවල වෙනස		-	17,679.47
			473,403.41	**6,823,748.10**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2020.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්

		එස්.එල්.එම්.ආර්.එස්	එස්.එල්.එම්.ආර්.එස්
		31.12.2020	**31.12.2019**
		රු. ශත.	රු. ශත.
(5)	**අපනයන සංවර්ධන වියදම්**		
	නිෂ්පාදන/ වෙළඳපල සංවර්ධන වැඩසටහන්	5,816,231.53	54,497,911.72
	අපනයන වෙළඳ ප්‍රදර්ශන වැඩසටහන් - විදේශීය	51,007,980.07	123,967,834.11
	වෙළඳ නියෝජිත චාරිකා සඳහා සහභාගිවීම්	-	459,283.22
	අපනයන වෙළඳ ප්‍රදර්ශන වැඩසටහන් - දේශීය	846,104.26	707,129.68
	WEDF	-	755,100.00
	ඒක්ස්පෝ ඩුබායි 2020	65,917.90	3,464,941.09
	අපනයන වෙළඳ ප්‍රදර්ශන - දේශීය	1,697,592.50	580,590.00
	ප්‍රතිපත්ති හා සැළසුම් වියදම්	617,301.79	2,581,663.25
	ප්‍රාදේශීය සංවර්ධන වියදම්	143,129.00	2,431,190.11
	වෙළඳ තොරතුරු හා සේවා වියදම්	6,519,463.12	10,366,783.49
	ශ්‍රී ලංකා කුරුඳු සන්නම් නිර්මාණය	6,025.00	-
		66,719,745.17	**199,812,426.67**
(6)	**පරිපාලන වියදම්**		
	වැටුප් හා වේතන	150,903,026.40	146,294,818.00
	අතිකාල හා නිවාඩු දීමනා	7,643,369.89	13,961,198.97
	ප්‍රසාද දීමනා	2,886,750.00	2,592,000.00
	සේවක අර්ථ සාධක අරමුදල	21,266,345.57	20,157,414.00
	සේවක භාරකාර අරමුදල	4,255,934.75	4,031,638.56
	පාරිතෝෂික දීමනා ගෙවීම්	14,074,497.00	10,928,619.75
	සේවක සුභසාධනය	8,563,862.11	13,288,873.63
	වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම්	12,963,501.07	10,433,627,65
	බඳවා ගැනීමේ වියදම්	462,752.00	663,272.19
	විදුලි ගාස්තු	16,756,661.88	22,763,533.10
	ජල ගාස්තු	559,835.55	886,939.89
	නීති හා වෙනත් වෘත්තීය ගාස්තු	299,001.60	354,246.00
	ප්‍රචාරණ ගාස්තු	476,262.99	680,046.77
	ආරක්ෂක වියදම්	2,267,589.47	4,002,006.63
	විගණන ගාස්තු	900,000.00	1,000,000.00
	මුද්‍රණ වියදම්	429,315.00	497,157.50
	ගමන් වියදම්	12,910,151.23	18,091,841.34
	විනෝදාශ්වාද	54,984.00	202,389.34
	පොදු වියදම්	259,962.13	870,714.89
	අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු	507,439.00	890,782.00
	කාර්යාල උපකරණ නඩත්තුව	1,133,001.99	1,988,231.25
	ගොඩනැගිලි කුලී	79,204,085.00	76,637,031.59
	ඉන්ධන හා තෙල්	1,878,229.85	3,697,279.59
	වාහන නඩත්තු අලුත්වැඩියා	2,961,443.20	5,066,679.77
	පුද්ගලික කුලී	6,430,521.00	7,437,997.11

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2020.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්

	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2020 රු. ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත.
පරිපාලන වියදම්		
සන්නිවේදන හා සාමාජික මුදල්	7,133,901.47	8,838,965.46
ISO ක්‍රියාත්මක කිරීමේ වියදම්	165,473.50	62,818.38
ක්ෂයවීම්	9,092,933.64	11,534,578.04
දේශීය පුහුණු වියදම්	644,134.87	1,977,714.38
කාර්යාල අවශ්‍යතා	2,950,813.14	4,946,428.55
රක්ෂණ හා බලපත්‍ර අලුත් කිරීමේ වියදම්	193,355.31	124,575.70
විදේශීය පුහුණු වියදම්	-	5,826,342.81
ආයෝජන වටිනාකම හානිකරණ සදහා ප්‍රතිපාදන	(49,000.00)	(475,108.70)
	370,180,134.61	**400,254,354.14**

(7) **මූල්‍ය පිරිවැය**

පොළී වියදම්	-	181,306.13
විනිමය අනුපාතවල වෙනස	6,325.58	-
මුද්දර ගාස්තු	65,197.76	1,416,869.76
මූල්‍ය වියදම්	201,968.92	486,567.93
	273,492.26	**2,084,743.82**

(8) දේපල, යන්ත්‍ර හා උපකරණ

(8.1) පිරිවැය

ශේෂය 01/01/2019	වත්කම්	ශේෂය 01/01/2020	එකතුකිරීම්	නැවත තක්සේරු කිරීම්	ඉවත්කිරීම්	ශේෂය 31/12/2020
75,376,450.00	මෝටර් රථ	71,726,450.00	-	-		71,726,450.00
41,839,508.52	පරිඝණක	41,965,388.52	4,002,359.60	-	-	45,967,748.12
5,734,481.00	පරිඝණක මෘදුකාංග	5,734,481.00	-	-	-	5,734,481.00
1,760,910.57	පරිඝණක උපකරණ	1,962,456.07	64,550.00	-	-	2,027,006.07
735,930.00	කියෝස්ක් පද්ධතිය	735,930.00	-	-	-	735,930.00
4,816,845.01	රූපවාහිනී උපකරණ	4,816,845.01	-	-	-	4,816,845.01
65,549.00	PABX උපකරණ	143,174.00		-	-	143,174.00
1,720,102.14	දුරකථන සවිකිරීම්	1,769,554.64	29,500.00	-	-	1,799,054.64
16,326,607.07	ලී බඩු සවිකිරීම්	16,378,158.95	232,300.00	-	-	16,610,458.95
17,498,514.09	කාර්යාල උපකරණ	18,622,950.59	76,125.00	-	-	18,699,075.59
15,240.00	වෙනත් උපකරණ	34,740.00		-	-	34,740.00
116,442.00	ගෘහස්ත දුරකතන	116,442.00	-	-	47,202.00	69,240.00
166,006,579.40		**164,006,570.78**	**4,404,834.60**	-	**47,202.00**	**168,364,203.38**

(8.2) ක්ෂය වෙන්කිරීම්

ශේෂය 01.01.2019	වත්කම්	ශේෂය 01/01/2020	පෙර වර්ෂ සඳහා ගැලපුම්	වර්ෂය සඳහා ක්ෂය	ඉවත්කිරීම් සඳහා ක්ෂය	ශේෂය 31/12/2020
43,800,998.32	මෝටර් රථ	54,513,643.32	-	3,822,645.0	-	58,336,288.32
34,716,682.27	පරිඝණක	7,019,223.97	-	2,165,834.4̂	-	39,185,058.44
4,684,870.99	පරිඝණක මෘදුකාංග	5,082,170.99	-	397,300.00̂	-	5,479,470.99
1,114,873.81	පරිඝණක උපකරණ	1,364,376.95	9,822.15	238,103.44	-	1,612,302.54
306,637.50	කියෝස්ක් පද්ධතිය	453,823.50	-	147,186.00	-	601,009.50
4,215,231.00	රූපවාහිනී උපකරණ	4,445,942.11	-	230,711.11	-	4,676,653.22
53,861.81	PABX උපකරණ	65,591.71	-	14,317.40	-	79,909.11
1,580,332.41	දුරකථන සවිකිරීම්	1,636,132.56	(30,765.72)	52,350.38	-	1,657,717.22
8,875,044.79	ලී බඩු සවිකිරීම්	9,724,600.38	-	856,607.75	-	10,581,208.13
14,040,340.77	කාර්යාල උපකරණ	15,112,334.13	-	1,150,184.4	-	16,262,518.54
5,384.49	වෙනත් උපකරණ	15,880.11	-	11,275.36̂	-	27,155.47
75,878.79	ගෘහස්ත දුරකතන	82,750.76	19,697.63	6,418.32	45,235.15	63,631.56
113,470,136.95		**129,516,470.49**	**(1,245.94)**	**9,092,933.64**	**45,235.15**	**138,562,923.04**

2018	*ලියා හරින ලද වටිනාකම්*	2020	2019
166,006,579.40	පිරිවැය	168,364,203.38	164,006,570.78
(113,470,136.95)	සමුච්චිත ක්ෂයවීම්	(138,562,923.04	(129,516,470.49)
52,536,442.45	ලියා හරින ලද වටිනාකම	**29,801,280.34**	**34,490,100.29**

			එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2020 රු. ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත.
(9)	**ආශ්‍රිත සමාගම් වල ආයෝජන - ලයිස්තුගත නොවන**			
	ආශ්‍රිත සමාගම් වල ආයෝජන - ඩී.එච්.පී.එල්		1,123,606,578.07	1,052,821,878.95
			1,123,606,578.07	**1,052,821,878.95**
(10)	**වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්**			
	කොටස්වල ආයෝජන	**(10.1)**	23,104,288.82	25,084,418.82
	කාර්ය මණ්ඩල ණය - ජංගම නොවන	**(12.1)**	29,760,817.08	29,715,664.41
			52,865,105.90	**54,800,083.23**
(10.1)	**කොටස් වල ආයෝජන**			
	නිදහස් කළ හැකි වරණීය කොටස්		105,117,477.60	105,117,477.60
	සාමන්‍ය කොටස්		56,332,353.61	58,312,483.61
	(-) හානිකරණ සඳහා වෙන්කිරීම්		(138,345,542.39)	(138,345,542.39)
			23,104,288.82	**25,084,418.82**
(11)	**තොගය**			
	ලිපිද්‍රව්‍ය		2,857,902.89	2,797,044.96
			2,857,902.89	**2,797,044.96**
(12)	**වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ**			
	අපනයනකරුවන්ගේ ණය		40,213,508.60	40,262,508.60
	(-) ණයගැති හානිකරණ වෙන්කිරීම්		(40,213,508.60)	(40,262,508.60)
	කාර්ය මණ්ඩල ණය - ජංගම	**(12.1)**	14,331,999.72	14,531,774.33
	ලැබිය යුතු එකතුකල අගය මත බදු		104,676,878.80	104,676,878.80
	ඌව පරණගම අපනයන ගම්මාන - පාලන ගිණුම		10,403,683.00	10,403,683.00
	වෙනත් ණයගැති		15,600,844.71	15,588,234.95
			145,013,406.23	**145,200,571.08**
(12.1)	**කාර්ය මණ්ඩල ණය**			
	ජංගම නොවන			
	කාර්ය මණ්ඩල ණය		31,199,903.85	33,127,689.50
	(-) ගෙවිය යුතු සේවක පිරිවැය		(19,048,923.60)	(19,543,308.02)
	පෙරගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ		17,609,836.83	16,131,282.93
			29,760,817.08	**29,715,664.41**

		එස්.එල්.එෆ්.ආර්.එස්	එස්.එල්.එෆ්.ආර්.එස්
		31.12.2020	**31.12.2019**
		රු. ශත.	රු. ශත.
	කාර්ය මණ්ඩල ණය		
	ජංගම		
	කාර්ය මණ්ඩල ණය	10,037,905.54	9,610,628.80
	වෙළඳපල අනුපාත මත ගෙවිය යුතු පොළිය	4,465,289.08	5,225,047.88
	(-) නොගෙවූ ණය සඳහා වෙන්කිරීම්	(63,884.30)	(63,884.30)
	(-) ගෙවිය යුතු සේවක පිරිවැය	(1,420,450.46)	(1,374,769.13)
	පෙරගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	1,313,139.85	1,134,751.08
		14,331,999.72	**14,531,774.33**
(13)	**අත්තිකාරම් හා පෙර ගෙවුම්**		
	පෙර ගෙවුම්	2,261,989.52	26,128,827.21
	අත්තිකාරම්	2,896,918.98	2,975,042.46
	බැංකු සුරක්ෂිත	300,000.00	300,000.00
	සේවා තැන්පතු	1,695,555.00	1,322,260.00
		7,154,463.50	**30,726,129.67**
(14)	**මුදල් හා මුදල් සමාන දෑ**		
	ලංකා බැංකුව - මුදල් අයකැමි තැන්පතුව	2,500.00	2,500.00
	ලංකා බැංකුව - ලේක්වීව් ශාඛාව	25,230,747.79	9,451,814.14
	ජාතික සංවර්ධන බැංකුව	313,562.18	2,626,497.33
	ලංකා බැංකුව - කෝපරේටි ශාඛාව	1,943,606.60	685,763.48
	ඩී.එෆ්.සී.සී බැංකුව - කෝපරේටි ශාඛාව	148,890.00	148,890.00
	ලංකා බැංකුව - ඉල්ලුම් තැන්පතු	10,000.00	10,000.00
	සම්පත් බැංකුව - මහනුවර	5,560.66	5,759.10
	සම්පත් බැංකුව - ගාල්ල	7,371.02	7,747.94
	ලංකා බැංකුව - මන්නාරම	27,595.82	27,195.30
	සම්පත් බැංකුව - කුරුණෑගල	17,426.58	17,578.47
	අතැති මුදල්	26,763.59	26,670.98
		27,734,024.24	**13,010,416.74**
(15)	**රාජ්‍ය ලැබීම් - ප්‍රාග්ධන දායකය**		
	රජයේ දායකය	7,904,002.00	7,904,002.00
	යූ.එන්.ඩී.පී. දායකය	2,110,282.00	2,110,282.00
		10,014,284.00	**10,014,284.00**
(16)	**රාජ්‍ය ලැබීම්**		
	රජයේ දායකය - මෝටර් රථ	38,826,450.00	38,826,450.00
	රජයේ දායකය - වෙනත්	20,491,468.90	16,086,634.30
	අයි.ටී.සී දායකය	12,716.35	12,716.35
	අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය	202,677.32	202,677.32
	රාජ්‍ය ලැබීම් - වෙළඳපල ප්‍රවේශ වැඩසටහන	939,000.00	939,000.00
	(-) රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය	(36,548,993.56)	(29,482,477.11)
		23,923,319.01	**26,585,000.86**

		එස්.එල්.එෆ්.ආර්.එස් **31.12.2020** රු. ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් **31.12.2019** රු. ශත.
(17)	**වෙනත් වගකීම් හා වෙන්කිරීම්**		
	ඌව පරණගම අපනයන සැකසුම් ගම්මානය	2,108,251.77	2,108,251.77
	අපනයනකරුවන්ගේ දායකයත්වය	11,829,741.00	46,033,761.00
	ආපසු ගෙවිය යුතු තැන්පතු	8,762,384.12	9,232,384.12
		22,700,376.89	**57,374,396.89**
(18)	**පාරිතෝෂික සඳහා වෙන්කිරීම්**		
	01.01.2020 වන විට ශේෂය	75,445,155.25	78,998,235.75
	වර්ෂය තුලදී කල වෙන්කිරීම්	14,074,547.00	10,928,619.75
	වර්ෂය තුලදී කල ගෙවීම්	(12,252,324.75)	(14,481,700.25)
	31.12.2020 වන විට ශේෂය	**77,267,377.50**	**75,445,155.25**
(19)	**වෙනත් ගෙවිය යුතු දෑ**		
	ගෙවිය යුතු මුද්දර ගාස්තු	27,675.00	31,075.00
	ගෙවිය යුතු උ.වි.ගෙ බදු	-	42,461.00
	ගෙවිය යුතු විවිධ වියදම්	26,080.15	46,059.72
	ගෙවිය යුතු සේ.අ.අ. වියදම්	2,890,905.51	2,805,494.66
	ගෙවිය යුතු සේ.භා.අ. වියදම්	346,908.66	336,659.34
	ගෙවිය යුතු සේවක අවසාන ගෙවීම්	43,997.13	47,781.13
	ගෙවිය යුතු රදවාගැනීමේ බදු	-	4,053,473.14
	ගෙවිය යුතු වැටුප්	160,672.30	166,536.31
	ගෙවිය යුතු විගණන ගාස්තු	1,890,000.00	3,680,200.00
	නැවත ගෙවිය යුතු ආරක්ෂණ තැන්පතු	2,500.00	2,500.00
	නැවත ගෙවිය යුතු තැන්පතු - ටෙන්ඩර්	261,000.00	287,000.00
	ඉදිරිපත් නොකල චෙක්පත්	140,476.36	119,036.74
	වෙනත් උපචිත වියදම්	102,740,134.14	78,877,848.66
	පාලන ගිණුම - ජාතික අපනයන උපායමාර්ග	5,816,722.59	996,081.85
	පාලන ගිණුම - වෙළඳපල ප්‍රවේශ වැඩසටහන	73,533.88	3,981,199.66
	පාලන ගිණුම - තොරතුරු තාක්ෂණ ආරම්භයන්	1,881,382.13	3,597,926.21
	පාලන ගිණුම - යටිතල පහසුකම්/ බෝට්ටු තැනීම්	131,534.60	373,305.54
		116,433,522.45	**99,444,638.96**

(20) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 39 ට අනුව හිමිකම් කොටස් ආයෝජනය හානිකරණ සඳහා පරීක්ෂා කරන ලදී. ඒ අනුව 01.01.2011 දිනට හානිකරණ වෙන්කිරීම් නැවත ගැලපීම රු. 31,698,150.00 කි.

(21) කාර්ය මණ්ඩල ණය

(21.1) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 9 ට අනුව පවත්නා වර්ෂයේ පොළී අනුපාත වලින් අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ණය මුදල් අගයන් සාධාරණ අගයට පොත්වල පෙන්වා ඇත. ගෙවිය යුතු විලම්භිත සේවක පිරිවැය හා පෙරගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ගැලපීමෙන් පසු අගය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ පෙන්වා ඇත.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ පෙන්වා ඇත්තේ පහත පරිදිය.

කාර්ය මණ්ඩල ණය	රු.	41,173,925.09
අඩුකලා: ගෙවිය යුතු විලම්භිත සේවක පිරිවැය	රු.	(20,469,374.06)
එකතුකලා: පෙරගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	රු.	18,922,976.68
එකතුකලා: පවත්නා වර්ෂයේ පොළී අනුපාතය අනුව අයකල යුතු පොළිය	රු.	4,465,289.08
	රු.	44,092,816.80

(21.2) සාධාරණ අගය ගණනය කිරීමේ දී හඳුනාගත් පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ අගය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කමක් ලෙස සටහන් කර ඇත. එය ණය කාලසීමාව තුල දී වියදමක් ලෙස හඳුනාගනු ඇත. 2020 වර්ෂයට අදාළ ප්‍රමාණය පහත පරිදි ආදායම් ප්‍රකාශයට අය කර ඇත.

පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	රු.	17,266,034.01
එකතුකලා: නව සේවක ණය සඳහා පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	රු.	4,776,344.79
අඩුකලා: ආදායම් ප්‍රකාශයට අය කිරීම - 2020	රු.	(3,119,402.11)
වර්ෂ අවසාන ශේෂය	රු.	18,922,976.68

(22) පෙර වර්ෂයේ ගැලපීම්

පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් හි හඳුනා ගැනීම් සහ මිනුම් සම්බන්ධව සිදු වී ඇති වැරදි නිවැරදි කිරීම් වලට අදාළ ගැලපීම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සිදුකර ඇත. LKAS 8 හි අංක 50 දරණ වගන්තියට අනුව ‘‘අතීතයට බලපාන පරිදි භාවිතය සහ අතීතයට බලපාන පරිදි ප්‍රතිස්ථාපනය ප්‍රායෝගික නොවන බව යටතේ’’ මෙම ගැලපීම් මේ වර්ෂය තුල සිදුකර පහත පරිදි සටහනක් මඟින් පෙන්වා ඇත.

<u>පෙර වර්ෂයේ වැරදි වල ස්වභාවය</u>	මූල්‍ය ප්‍රකාශන වල බලපාන අයිතමය	<u>වටිනාකම (රු)</u>
ලියා හරින ලද වත්කම් ශේෂ	සමුච්චිත ලාභ ගිණුම	(2,045,383.84)
2020 වාර්තා කරන ලද පෙර වර්ෂ වලට අදාල වියදම්	අදාළ වියදම් ගිණුම්	(510,650.87)
අධි හා ඌන ප්‍රතිපාදන ආපසු හැරවීම	අදාළ වියදම් ගිණුම්	402,962.11
ක්ෂයවීම් හා ලෙජර් ගිණුම් වල වාර්තා කිරීම් නිවැරදි කිරීම්	අදාළ වියදම් ගිණුම්	65,800.58
පූර්ව වර්ෂ වලට අදාළ ප්‍රතිපාදන සැපයීම	අදාළ වියදම් ගිණුම්	971,505.14
චෙක්පත් කල් ඉකුත්වීම හේතුවෙන් අවලංගු කිරීම	අදාළ ලෙජර ගිණුම්	815,000.00
		(300,766.88)

(23) සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු.

සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු ලෙස සළකනු ලබන්නේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වල දී ආශ්‍රිත සමාගම වන ඩිවෙලොප්මන්ට් හෝල්ඩින්ග්ස් සමාගම වෙත කරනු ලබන ගෙවීම් ය. වර්ෂය තුලදී සිදු කරනු ලැබූ ගෙවීම් සහ ගෙවිය යුතු අගයන් ඇතුලත් පහත තොරතුරු LKAS 24 (18 වන ඡේදය) අනාවරණය කිරීමේ අවශ්‍යතා අනුව ඉදිරිපත් කෙරේ.

<u>නම</u>	<u>ගනුදෙනුව</u>	<u>2020 (රු.)</u>	<u>2019 (රු.)</u>
ඩිවෙලොප්න්ට්	මාසික කුළිය	74,460,000.00	73,010,000.00
හෝල්ඩින්ග්ස්	වාහන ගාල් කිරීමේ ගාස්තු	714,000.00	796,785.74
(පුද්ගලික)	විදුලිබල වියදම්	15,784,670.41	18,713,737.90
සමාගම	ජල වියදම්	210,435.63	337,401.34
	වායුසමීකරණ වියදම්	49,496.20	121,239.92
	සනීපාරක්ෂක වියදම්	288,351.21	182,181.07
	ශ්‍රවණාගාර ගාස්තු	588,073.91	1,308,082.72
	ලාභාංශ ලැබීම්	38,580,758.02	34,634,083.40

(24) අසම්භාව්‍ය වත්කම් හා වගකීම්

පහත සඳහන් විස්තර හැර ශේෂ පත්‍ර දිනට වෙනත් අවිනිශ්චිත වත්කම් හෝ වගකීම් නොමැත.

	2020.12.31 දිනට පැවති අසම්භාව්‍ය වත්කම් හා වගකීම් වල ස්වභාවය	අසම්භාව්‍ය වත්කම හටගත් පාර්ශවය	ඇස්තමේන්තු ගත මුදල් ගලා ඒම	මුදල් ලැබීම් මැනීමට නොහැකි නම්
i.	නොගෙවන ලද කුළී, විදුලිය හා පවිත්‍රතා ගාස්තු අයකිරීමට නඩු පැවරීම - චෙන්නායි වෙළඳ මධ්‍යස්ථානය.	පීමා හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම	359,151.00	
		ජෙම් නේශන් (පුද්ගලික) සමාගම	2,226,546.78	
		යුනික් මල්ටි ආර්ටිස්ට්	194,142.50	නීති වියදම
		සාරා ඔෆ් ලෙදර්ස් (පුද්ගලික) සමාගම	1,131,017.00	-
ii.	ණය පැහැරහැරීම්	වර්ක්ස් ඔෆ් ආර්ට්	29,000.00	-
		රාජාස් ජුවෙලරි	90,418.00	-
		සිලෝන් ඕනමෙන්ටල් සෙරමික්ස්	289,720.00	-
		කොකොනට් හස්ක් චිප්ස්	26,809.46	-
		සමන් ජෙම් ඇන්ඩ් ජුවෙලර්ස්	252,912.02	-
		යුනිසයිකල් මාර්කටින්	278,455.58	-
		වර්ල්ඩ් ෆැෂන්	30,000.00	-
		යුනික් මල්ටි ආර්ටිස්ට්	187,006.54	-
iii.	බැඳුම්කරය ආපසු ගැනීම	සිරිකුමාර	104,725.45	-
iv.	අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගෙවන ලද අත්තිකාරම් ගෙවීම් ආපසු ගෙවීමේ නඩුව.	සෝලාර් ග්‍රීන් ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම	1,505,932.00	-
V.	වැටුප් අයකර ගැනීම - සමත මණ්ඩලයේ මැදිහත්වීමෙන් අනතුරුව.	ගිහාන් චතුරංග	562,856.75	-
		ඩබ්.එච්.සී.ඩබ්. ප්‍රනාන්දු	46,783.93	-
		එන්.ඩබ්.ඩී. සිහිනුවන්	50,677.50	-

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TCM2/F/EDB/1/20/08 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 මැයි 19 දින

සභාපති
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව ගෙවිය යුතු පාරිතෝෂික ප්‍රතිපාදන ගණනයේදී නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගය පෙන්නුම් කල යුතු අතර ඒ සඳහා සියළු ආයුගණක ලාභයන් සහ අලාභයන් විස්තීරණ ආදායම් ප්‍රකාශයේදී සලකා බැලිය යුතු වුවද මණ්ඩලය සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික වෙන්කිරීමේදී ප්‍රමිත 19 අනුකූලව ගණනය කිරීම් සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව වෙනත් විස්තීරණ ආදායම්වල ආයුගණක වාසි අවාසිවල වෙනස්කම් ඒවා පැනනගින කාලපරිඡේදයේ වෙනත් විස්තීරණ ආදායමේ කොටසක් ලෙස සැලකිය යුතු වුවද මණ්ඩලය එසේ සලකා බලා නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2020 දෙසැම්බර් 31 දිනට රු.6,167,225 ක් වූ අනෙකුත් ණයගැති ශේෂය තුල වර්ෂ 5 ට වැඩි එකතුව රු.2,482,492 ක ණයගැති ශේෂ පවතින අතර රු.2,719,738 ක් වූ ණය ශේෂය සඳහා ණය ලබා දුන් දිනයන් හඳුනාගත නොහැකි වී තිබූ අතර නැවත අයකර ගැනීම අවිනිශ්චිත වූවත් මේ සඳහා හානිකරණ වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ 2009 වර්ෂයේ සිට පැවත එන රු.10,403,683 ක ණය ශේෂය වසර 10 ක් ගත වී ඇති අතර නැවත අයකර ගැනීම අවිනිශ්චිත වූවත් මේ සඳහා හානිකරණ වෙන් කිරීමක් ද සිදු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

2009 වර්ෂයේ සිට පැවත එන අපනයනකරුවන්ගේ ණය ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට රු.40,213,508 ක් විය. එම මුළු මුදල සඳහාම හානිකරණ වෙන්කිරීමක් සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී රු. 49,000 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) කළමනාකරණ හා මෙහෙයුම් අකාර්යක්ෂමතාව

(i) මණ්ඩලය විසින් 2020 දෙසැම්බර් 31 දිනට වසා දමනු ලැබූ සහ අක්‍රීය තත්වයේ පවතින සමාගම් 29 ක වරණීය කොටස්වල සහ සමාගම් 33 ක සාමාන්‍ය කොටස්වල පිළිවෙලින් රු.105,111,477 හා රු.58,312,483 ක් ආයෝජනය කර තිබූ අතර එම සමාගම්, සමාගම් පනතේ 487(3) වගන්තිය ප්‍රකාරව සමාගම් ලියාපදිංචි නාම ලේඛනයෙන් නාමය කපා හරින ලද සමාගම් වේ. එවැනි සමාගම් සතු දේපල 487(5) වගන්තිය ප්‍රකාරව රජය වෙත පවරාගත හැකි වුවද, පවරා ගත හැකි ක්‍රමවේදයක් එහි දක්වා නොමැති බැවින් සමාගම් පනත

සංශෝධනය කළ යුතු බව නීතිපති විසින් දන්වා එවා තිබුණි. කෙසේ වෙතත් මෙම සමාගම් සොයාගැනීමට නොහැකි වී ඇති බැවින් නීතිමය පියවර ගැනීමට නොහැකි වී තිබූ අතර මණ්ඩලය විසින් ඒ සඳහා හානිකරණ වෙන් කිරීමක් සිදුකර තිබුණි.

(ii) 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 258 ක් වුවත් සත්‍ය කාර්ය මණ්ඩලය 211 ක් වූයෙන් තනතුරු 47 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් ද, කණිෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් සහ පහළ මට්ටමේ තනතුරු 25 ක් ද විය. මෙම පුරප්පාඩු අතර ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට ඍජුවම අදාල වන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), අධ්‍යක්ෂ (නිෂ්පාදන), අධ්‍යක්ෂ (අපනයන සේවා) වැනි තනතුරු පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **අනාර්ථික වියදම්**

මණ්ඩලයට සියයට 41 ක ප්‍රාග්ධන හිමිකාරිත්වයක් ඇති DHPL සමාගමේ ගොඩනැගිල්ලේ 5, 6, 7, 8 සහ 9 යන මහල් 5 ක එනම්, වර්ග අඩි 44,990 ක මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන අතර වර්ග අඩියකට රු.1,655 බැගින් වූ සමාලෝචිත වර්ෂයට අදාල බදු කුලිය රු.74,460,000 ක් විය. බදු කුලී ගිවිසුම වර්ෂ 2 කට වරක් අළුත් කරනු ලබන අතර එහිදී වාර්ෂික කුලිය වැඩිවීම 2018 ට වඩා 2019/2020 වර්ෂවලදී රු.6,960,000 කින් ද 2020 වර්ෂයට වඩා 2021/2022 යන වර්ෂවලදී රු.8,214,000 කින් ද වැඩි වී තිබුණි. මණ්ඩලයට වාර්ෂිකව මෙපමණ බදු කුලියක් ගෙවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ගෙවිය යුතු බදුකුලිය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ උපචිත බදු කුලිය රු.74,459,700 ක් විය. තවද මෙම ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන වෙනත් ආයතන වාසිදායක මිලකට එම මහල් මිලදී ගෙන තිබූ නමුත් මණ්ඩලය එවැනි වාසිදායක විකල්ප ක්‍රමයක් වෙත යොමු වී නොතිබූ අතර ආශ්‍රිත සමාගමේ ආයෝජන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.109,365,467 ක ලාභ කොටසක් හිමි වුවද ඉන් සියයට 64 ක් බදු කුලී ලෙස එම සමාගමට ගෙවීමට සිදු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති